
# මහා සභා

# රැස්වීම් වාර්තාව

# 2023.02.01



මීගහකිවුල ප්‍රාදේශීය සභාව

055-2245775

**2023.02.01 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව**

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

**පැමිණීම.**

01. ගරු සභාපති - එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා
02. ගරු උප සභාපති - ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සුමතිපාල උඩලකුඹුර මැතිතුමා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.එම්.ශ්‍රියාලතා මැතිණිය
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.ශ්‍රියාණි සාමාවතී මැතිණිය
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එම්.නිශාදි ශිරන්තිකා මැතිණිය
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී. බාලසුන්දරම් මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.එන්.එම්.නන්දන සම්පත් උදය කුමාර මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.චමින්ද ප්‍රදීප් මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.මංජුල දිසානායක මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.පත්මා කුමාරි මැතිණිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා
18. සභා ලේකම් - ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙය
19. විෂය නිලධාරි - ආර්.එම්.නිල්මිණී සකුන්තලා මිය

**සභාව ආරම්භ කිරීම.**

පෙ.ව.11.00ට ගරු සභාපතිතුමා මූලාසනය ගනිමින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා,ගරු මන්ත්‍රීතුමන්ලාත්, ගරු මන්ත්‍රීතුමියන්ලාත්, සභා ලේකම්තුමිය හා විෂය නිලධාරි පිළිගනිමින් සභා රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදී. මූලාසනය විසින් එදින න්‍යාය පත්‍රානුකූලව මුලින්ම පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීමට සභාවට ඉදිරිපත් කරන ලදී.

**(අ) පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කර ගැනීම.**

මෙහිදී මූලාසනය සභාව අමතමින් ගරු මන්ත්‍රීවරුනි, පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව කියෙව්වා සේ සළකා සභා යෝජනා ස්ථිරත්වයෙන් සම්මත කර, සභා වාර්තාවල සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙස මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

**මූලාසනය අමතමින්,පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බැවින් සභා සම්මත කිරීම, සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

මූලාසනය සභාව අමතමින්, පසුගිය සභා වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙස මම මේ ගරු සභාවට දන්වා සිටිනවා.

මූලාසනය සභාව අමතමින්, පසුගිය සභා වාර්තාවේ හදිසි යෝජනා අංක 03 යටතේ ඉදිරිපත් කරන ලද යෝජනාව පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

මීගහකිවුල නගරයේ කඩ කාමර වර්ෂ 2019 තක්සේරුවට අනුව 2019 ඔක්තෝම්බර් 01 සිට 2022 සැප්තැම්බර් 30 දක්වා එම තක්සේරුවට අදාල කඩකුළී අය කරන ලදී. ඒ අනුව 2022 සැප්තැම්බර් මස වන තෙක් නව තක්සේරුව සිදු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවට නොහැකිවීම මත ඉන්පසු 2022.09.09 දින පැවති සභාවෙන් 2022.12.31 දක්වා පවතින කඩ කුලී මුදලම අයකිරීමට සභා අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව 2022.12.01 දිනට පෙර නව තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටියද ඔවුන්ගේ කාර්ය මණ්ඩලයෙහි පවතින පුරප්පාඩු මත මේ වන තෙක් අදාල කඩ තක්සේරුව සිදු කිරීමට නොහැකි වූ බව දන්වන ලද අතර හැකි විගස තක්සේරුව සිදු කර දෙන බව දුරකතනය මගින් දන්වන ලදී. එසේ හෙයින් <u>**2022.10.01** දින සිට වසර **03**කින් කඩ ගිවිසුම් දීර්ඝ කිරීමට</u> හා නව තක්සේරුව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් සිදු කරන තෙක් 2023.01.01 දින සිට තාවකාලිකව ගාස්තු සංශෝධනය කර අය කිරීම **<u>හෝ පවතින කඩ කුලී ගාස්තු අය කිරීම</u>** සඳහා අවශ්‍ය සභා අනුමැතිය සඳහා සභා ගත කරන ලදී.

**මූලාසනය සභාව අමතමින් පෙ.ව.10.50ට ගරු මන්ත්‍රීවරුනි,මේ මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා සභාපති එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා යෝජනා කරන අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

**මූලාසනය සභාව අමතමින් පෙ.ව.10.55ට කාරක සභා අවස්ථාව මහා සභාවක් බවට පත් කිරීම සඳහා ගරු ප්‍රාදේශීය සභා සභාපති එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

කාරක සභා අවස්ථාවේදී, මීගහකිවුල නගරයේ කඩකාමර කුලී සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

ඒ අනුව, 2022.12.01 දිනට පෙර නව තක්සේරුව සිදු කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටියද ඔවුන්ගේ කාර්ය මණ්ඩලයෙහි පවතින පුරප්පාඩු මත මේ වන තෙක් අදාල කඩ තක්සේරුව සිදු කර නොමැත. එබැවින් <u>2022.10.01 දින සිට වසර 03කින් කඩ ගිවිසුම් දීර්ඝ කිරීම හා 2019.10.01 දින සිට ක්‍රියාත්මකව පැවති තක්සේරු</u> කඩකුලී ගාස්තුව ඉදිරියේදී අයකර ගෙන නව තක්සේරුව පැමිණි විගස නව තක්සේරුව ක්‍රියාත්මක කල යුතු දින සිට එම මුදල අය කර ගැනීම සඳහා හා ක්‍රියාත්මක දින සිට හිඟ මුදලද අය කර ගැනීමට කටයුතු සිදු කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා ස්ථිර කළේය.

මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත , එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

මූලාසනය සභාව අමතමින්, ඉහත සංශෝධනයන්ට යටත්ව පසුගිය මහා සභා වාර්තාව සම්මත කිරීම සඳහා මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා, සභාවේ සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත වූ බව සභාවට දන්වන ලදී.

මූලාසනය සභාව අමතා න්‍යාය පත්‍රානුකූලව විශේෂ නිවේදන ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

<u>(ආ) ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන.</u>

මූලාසනය සභාව අමතමින් මෙම සභා වාරය සඳහා විශේෂ නිවේදන කිසිවක් ලැබී නොමැති බව, මා මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

මූලාසනය සභාව අමතා න්‍යාය පත්‍රානුකූලව සංදේශ,පැමිණිලි,පෙත්සම් හා ආයාචනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

<u>(ඇ) සංදේශ, පෙත්සම්,පැමිණිලි සහ ආයාචනා සභා ගත කිරීම.</u>

මූලාසනය සභාව අමතමින්, මෙම සභා වාරය සඳහා සංදේශ,පැමිණිලි,පෙත්සම් හා ආයාචනා කිසිවක් ලැබී නොමැති බව, මා මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

මීළඟට මූලාසනය සභාව අමතා න්‍යාය පත්‍රානුකූලව කල්දෙනු ලැබූ ප්‍රශ්න ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

<u>(ඈ) කල්දෙනු ලැබූ ප්‍රශ්න.</u>

මූලාසනය විසින් කල්දෙනු ලැබූ ප්‍රශ්න සභාව හමුවේ තබන ලදී.

01) පසුගිය සභා වාරයේදී අප සභාව සතු රථ වාහන හා යන්ත්‍ර සූත්‍රයන්හි ඉන්ධන වියදම පිළිබඳ වාර්තාව 2023.01.03 දින මහා සභාවට ඉදිරිපත් කිරීමේදී අප සභාව සතු ZA 5003 දරණ බැකෝ යන්ත්‍රයෙහි ඉන්ධන යෙදූ දිනයන් හා කාර්යයන් සඳහා දරණ ලද වියදම නිවැරදිව සඳහන් කර ඇති අතර, රථය යෙදවූ කාර්යය සඳහන් කිරීමේදී " කසළ බැහැර කරන ස්ථානය සැකසීම" යන්න සඳහන් කළ යුතු වුවද , වාර්තාව සකස් කරන ලද නිළධාරියාගෙන් සිදු වූ අතපසු වීමකින් එය "කසළ ප්‍රවාහනය " ලෙස සඳහන් වී ඇත. එය සංශෝධනය කර ඇත. එම රථය සඳහා යොදන ලද ඉන්ධන ප්‍රමාණයේ විස්තර වාර්තාව පහත පරිදි වේ.

ඒ අනුව 2022.12.16 දින 758087 දරණ ඉන්ධන බිල්පත මගින් ලීටර් 80 ක ඉන්ධන ප්‍රමාණයක් රථයට යොදා 2022.12.16 දින මීටර් පැය 4.8 ක් හා ඉතිරි ඉන්ධන ප්‍රමාණයෙන් නැවත 2023.01.12 වන දින මීටර් පැය 4.3ක් ලෙස ඉන්ධන භාවිතා කරමින් කසළ බැහැර කරන ස්ථානය සැකසීම කර ඇත.

| දිනය | ලබා දුන් ඉන්ධන ප්‍රමාණය | ගැලුමකට සැතපුම් ගණන | කාර්යය | දිවූ සැතපුම් ගණන | වැඩ කර ඇති පැය ගණන | ඉතිරි ඉන්ධන ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| 2022.12.16 | ලීටර් 80 | 6.8 | ගොඩ ගැසී ඇති කසළ වළ, කාර්මික නිලධාරී නිර්දේශයට යටත්ව කසල බැහැර කිරීමට සුදුසු ලෙස සකස් කිරීම. | 4.8 | 4.8*6.8 = 32.64 | ලීටර් 47.36 |
| 2023.01.12 | 47.36 ( පෙර ඉතිරි ඉන්ධන ප්‍රමාණය ) | 6.8 | ගොඩ ගැසී ඇති කසළ වළ, කාර්මික නිලධාරී නිර්දේශයට යටත්ව කසල බැහැර කිරීමට සුදුසු ලෙස සකස් කිරීම. | 4.3 | 4.3*6.8 = 29.24 | ලීටර් 18.12 |

ඒ අනුව උක්ත වගුවෙහි සඳහන් පරිදි ඉන්ධන භාවිතය සිදු වී ඇත අතර දෛනික ධාවන සටහනෙහි කාර්මික නිළධාරීතුමන්ගේ අධීක්ෂණය යටතේ අදාල කාර්යය සිදු වූ බවට එතුමන්ගේ අත්සනද ධාවන සටහනෙහි යොදා ඇත.

දෛනික ධාවන සටහනෙහි 2022.12.16 දින හා 2023.01.12 දෙදින ඇතුලත් පත්‍රයන්හි සහතික කරන ලද පිටපත් ද පහතින් අමුණා ඇත.

මුල් පිටපත / ORIGINAL — 20 22 . 10 මාසයේ ........ වැනි ද වෙනුවෙන් වූ ධාවන සටහන / Running Chart for ........ day of ........ 20 ....

පොදු 268 වැනි ආකෘති පත්‍රය / Form General 268

දෙපාර්තමේන්තුවේ නම / Name of Department: [illegible]

දෙපාර්තමේන්තු/ලියාපදිංචි කළ අංකය / Department/Registration No.: ZA 5003

| ගියේ මොන වුවමනාවකටද සහ වග, පැටවූ මිනිස් කොතෙක් මිටු ආදියේ විස්තර / Purpose of Trip, Nature of Load, &c. | වේලාව TIME — පිටවූ Out | වේලාව TIME — පැමිණි පාවු In | මාර්ගය ROUTE — කොතැනින්ද/කොතැනටද From/To | මාර්ගය ROUTE — ගිය තැන් Places Visited | මාර්ගය ROUTE — කොයි පාරෙන්ද යන වග Via | ධාවනය කළ දුර / Mileage | වාහනය භාර නිලධාරී නිලධාරියාගේ කෙටි අත්සන / Initials of Officer |
|---|---|---|---|---|---|---|---|
| [illegible] | | | | 2022/10/29 | | | |
| [illegible] | | | [illegible] | [illegible] | [illegible] | | |
| | | | [illegible] | [illegible] | [illegible] | 1.6 | |
| [illegible] | | | | 2022/12/16 | | | |
| [illegible] | | | [illegible] | [illegible] | [illegible] | 4.8 | [initials] |
| [illegible] | | | [illegible] | | | | |
| [illegible] | | | | 2023/01/12 | | | |
| [illegible] | | | [illegible] | [illegible] | [illegible] | | |
| [illegible] | | | [illegible] | [illegible] | | 4.3 | [initials] |

රියදුරාගේ නම / Name of Driver: Y.M නුවන් [illegible]

| | | | |
|---|---|---|---|
| දිනය / Date 2022 10 | 29 | 12/16 | 2023 01/12 |
| මයිලෝමීටරයෙහි සඳහන් සැතැප්ම ගණන–පිටත්වන විට / Milometer Reading–Out | 2870.5 | 2872.1 | 2876.9 |
| එම පැමිණෙනවිට / Do. In | 2872.1 | 2876.9 | 2881.2 |
| දිවූ සැතැප්ම ගණන / Mileage | 1.6 | 4.8 | 4.3 |
| ගැලුම්කට සැතැප්ම ගණන / Miles per Gallon | 6.8 | 6.8 | 6.8 |
| රියදුරාගේ කෙටි අත්සන / Initials of Driver | [signature] | [signature] | [signature] |

| | | | |
|---|---|---|---|
| දිනය / Date 2022/10 | 10/29 | 12/16 | 2023 01/12 |
| ඉන්ධන තිබුණු ප්‍රමාණය– / Fuel Position– ටැංකියේ ගැලුම් / In tank Gallons | 4.83 | 13.95 | 61.31 |
| ගත්තා / Drawn | 20 | 80 | – |
| පාවිච්චි කළ / Consumed | 10.88 | 32.64 | 29.24 |
| ඉතුරුව තිබෙන හරිය / Balance | 13.95 | 61.31 | 32.07 |
| ඇන්ජින් තෙල්– / Engine Oil– | | | |
| ගත්තා පයින්ට් / Drawn Pints | | | |
| වාහනය භාර නිලධාරියාගේ කෙටි අත්සන / Initials of O.I.C. | | | |

ඇණවුමේ අංකය හා දිනය / Order No. and Date: 758087

වෙනත් කිය යුතු දේ / REMARKS

02) පසුගිය සභා වාරයේදී 2022 දෙසැම්බර් මස අප සභාවෙ ගෙවීම් වාර්තාව 2023.01.03 දින මහා සභාවට ඉදිරිපත් කිරීමේ දී සභාව වෙත දෛනික වැටුප් මත බඳවා ගත් ඩබ්.කේ.එච්.නුවන් මහතාට 2022 සැප්තැම්බර්,ඔක්තෝම්බර් මස වල ගෙවිය යුතු දෛනික වැටුප් ගෙවීම සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්තුමා වෙත යොමු කරන ලදී. ඒ අනුව, වාර්තාව ලද පසු ඉදිරි සභා වාරයේදී ඒ පිළිබඳව ගත් තීරණය සම්බන්ධව වාර්තාව ඉදිරිපත් කරමි.

මීළඟට මූලාසනය සභාව අමතා, න්‍යාය පත්‍රානුකූලව යථා පරිදි කල් දී ඇති යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා.**

මූලාසනය සභාව අමතමින්, මෙම සභා වාරය සඳහා යථා පරිදි කල් දී ඇති යෝජනා කිසිවක් නොමැති බව, මා මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

මූලාසනය සභාව අමතා න්‍යාය පත්‍රානුකූලව හදිසි යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

හදිසි යෝජනා

මූලාසනය සභාව අමතමින්, හදිසි යෝජනා අංක 01 ඉදිරිපත් කරන ලදි.

01) මූලාසනය විසින් සභාව අමතමින්, LDSP ව්‍යාපෘතිය යටතේ PT2 අරමුදල් මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත මීගහකිවුල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ගොවීන්ගේ දේශිය කෘෂි නිෂ්පාදන එකතුකර අලෙවි කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා මීගහකිවුල නව බස්නැවතුම්පොල ගොඩනැගිල්ල වැඩිදියුණු කර යොදා ගැනීමට නියමිත වේ.ඒ අනුව මීගහකිවුල සතිපොලද එම භූමියේ ස්ථාපිත කිරීමට නියමිත අතර ඉදිරි ව්‍යාපෘතියක් යටතේ සතිපොල ගොඩනැගිල්ල උත්සව ශාලාවක් ලෙස වැඩිදියුණු කිරීමට නියමිත වේ. ඒ අනුව මීගහකිවුල සතිපොල සම්පූර්ණයෙන් සතිපොල භූමියේ ස්ථාපිත කිරීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදි.

**LDSP ව්‍යාපෘතිය යටතේ PT2 අරමුදල් මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත මීගහකිවුල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ගොවීන්ගේ දේශිය කෘෂි නිෂ්පාදන එකතුකර අලෙවි කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා මීගහකිවුල නව බස්නැවතුම්පොල ගොඩනැගිල්ල වැඩිදියුණු කර යොදා ගැනීමට නියමිත වේ. ඒ අනුව මීගහකිවුල සතිපොලද එම භූමියේ ස්ථාපිත කිරීමට නියමිත අතර ඉදිරි ව්‍යාපෘතියක් යටතේ සතිපොල ගොඩනැගිල්ල උත්සව ශාලාවක් ලෙස වැඩිදියුණු කිරීමට නියමිත වේ. ඒ අනුව මීගහකිවුල සතිපොල සම්පූර්ණයෙන් සතිපොල භූමියේ ස්ථාපිත කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදි.**

මීළඟට මූලාසන සභාව අමතමින්, හදිසි යෝජනා අංක 02 ඉදිරිපත් කරන ලදි.

02) මූලාසනය සභාව අමතමින්, LDSP ව්‍යාපෘතියේ PT2 යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා 2022.10.20 දින පැවති හදිසි අර්බුදයට ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතා හඳුනාගැනීමේ වැඩමුළුවේදී යෝජනා ලබාගත් අතර එහිදී මීගහකිවුල නව බස්නැවතුම්පොල ගොඩනැගිල්ල යොදාගෙන මීගහකිවුල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ගොවීන්ගේ දේශිය කෘෂි නිෂ්පාදන එකතු කර අලෙවි කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම හා සතිපොල නව බස්නැවතුම්පොල භූමියේ ස්ථාපිත කිරීම යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා LDSP ව්‍යාපෘති කමිටුවේ අනුමැතිය නොලැබුණහොත් ප්‍රාදේශිය සභා භූමියේ දිවා සුරකුම් මධ්‍යස්ථානයක් හා ඊ - පුස්තකාලයක් ස්ථාපිත කිරීම යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදි.

**LDSP PT2 යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා 2022.10.20 දින පැවති හදිසි අර්බුදයට ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතා හඳුනාගැනීමේ වැඩමුළුවේදී යෝජනා ලබාගත් අතර එහිදී මීගහකිවුල නව බස්නැවතුම්පොල ගොඩනැගිල්ල යොදාගෙන මීගහකිවුල ප්‍රා.ලේ කොට්ඨාසයේ ගොවීන්ගේ දේශිය කෘෂි නිෂ්පාදන එකතු කර අලෙවි කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම හා සතිපොල නව බස්නැවතුම්පොල භූමියේ ස්ථාපිත කිරීම යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා LDSP ව්‍යාපෘති කමිටුවේ අනුමැතිය නොලැබුණහොත් ප්‍රාදේශිය සභා භූමියේ දිවා සුරකුම් මධ්‍යස්ථානයක් හා ඊ - පුස්තකාලයක් ස්ථාපිත කිරීම යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදි.**

මීළඟට මූලාසන සභාව අමතමින්, හදිසි යෝජනා අංක 03 ඉදිරිපත් කරන ලදි.

03) මූලාසනය සභාව අමතමින්, LDSP PT2 යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාලව ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව පහත සඳහන් කමිටු පිහිටුවා ගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදි.

තාක්ෂණික ඇගයීම් කමිටුව

| | | |
|---|---|---|
| 1.වී.සෙන්තූර් කුමාර් මහතා | - දිස්ත්‍රික් ඉංජිනේරු | - ඌව පළාත් පාලන දෙපාර්තමේන්තුව,බදුල්ල |
| 2.ආර්.එම්.එල්.ජේ. රත්නායක | - කාර්මික නිලධාරි | - ප්‍රාදේශිය සභාව, මීගහකිවුල |
| 3.එස්.එම්.එස්.යූ. සමරකෝන් මහතා | - සංවර්ධන නිලධාරි | - ඌව පළාත් පාලන දෙපාර්තමේන්තුව |

ප්‍රසම්පාදන කමිටුව

1.එස්.එම්.එල්.එච් ජයවර්ධන මැතිතුමා,සභාපති,ප්‍රාදේශිය සභාව,මීගහකිවුල
2.ආර්.පී කපිල ආනන්ද රාජපක්ෂ මහතා,යමුනා ස්ටෝර්ස් ඉදිරිපිට,කරමැටිය,මීගහකිවුල
3ආර්.එම නිශාදි ශිරන්තිකා මහත්මිය,රිල්පොලවත්ත,කළුගහකදුර
4.ඩී.එම මංජුල දිසානායක මහතා,අලකොලඅරාව,පොල්ගහඅරාව,අරාව
5.ඩී.එම්.කේ.ඩී දිසානායක මෙය,සභා ලේකම්, ප්‍රාදේශිය සභාව,මීගහකිවුල
6.ඩබ්.ජී.එස්.ආර් විජේසිංහ මහතා,විමර්ශණ නිලධාරි,පළාත් පාලන දෙපාර්තමේන්තුව,බදුල්ල
7.පී.කේ ද සොයිසා මහත්මිය,සංවර්ධන නිළධාරි,ප්‍රාදේශිය සභාව,මීගහකිවුල

**LDSP PT2 යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාලව ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව ඉහත සඳහන් කමිටු පිහිටුවාලීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී,ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත , එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදි.**

මීළඟට මූලාසන සභාව අමතමින්, හදිසි යෝජනා අංක 04 ඉදිරිපත් කරන ලදී.

**04)** මූලාසනය සභාව අමතමින්, මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් UPPE-5483 නිළ කැබ් රථය සඳහා 2023 ජනවාරි මස අනුම
ඉන්ධන සීමාව ඉක්මවා වැය කළ අමතර ඉන්ධන ලීටර් 165 සඳහා අවශ්‍ය සහා අනුමැතිය සඳහා සභා ගත කරන ලදී.

**මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් UPPE-5483 නිළ කැබ් රථය සඳහා 2023 ජනවාරි මස අනුමත ඉන්ධන සීමාව ඉක්මවා වැය ක අමතර ඉන්ධන ලීටර් 165 සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතු යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දිසානායක මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, එම යෝජනාව ඒකමතිකව සභා සම්ම වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළඟට මූලාසන සභාව අමතමින්, හදිසි යෝජනා අංක 05 ඉදිරිපත් කරන ලදී.

**05)** මූලාසනය සභාව අමතමින්, 2021 වර්ෂයේ ඉකෝ විෂන් ආයතනයෙන් සූර්ය පැනල ලබා ගත්තද මුදල් ගෙවීම ප්‍රමාද වී
හේතුවෙන් එම ආයතනය වෙත නැවත සූර්ය පැනල භාර දීමට සිදු විය. එබැවින් එම මුදලින් නියමිත ප්‍රසම්පාදන ක්‍රමය යටතේ
නැවත 2023 වර්ෂයේ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සභා අනුමැතිය සඳහා සභා ගත කරන ලදී.

**2021 වර්ෂයේ ඉකෝ විෂන් ආයතනයෙන් සූර්ය පැනල ලබා ගත්තද මුදල් ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් එම ආයතනය වෙත නැවත සූර් පැනල භාර දීමට සිදු විය. එබැවින් එම මුදලින් නියමිත ප්‍රසම්පාදන ක්‍රමය යටතේ නැවත 2023 වර්ෂයේ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරී සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා යෝජනා කළ අතර එ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දිසානායක මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, එම යෝජනාව ඒකමතිකව සභා සම්ම වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළඟට මූලාසන සභාව අමතමින්, හදිසි යෝජනා අංක 06 ඉදිරිපත් කරන ලදී.

06) මූලාසනය සභාව අමතමින්, පුංචි ලෝකාන්තය සංචාරක ස්ථානය මේ වන විට මීගහකිවුල ප්‍රාදේශීය සභාව යටතේ පාලනය ව
අතර LDSP ව්‍යාපෘතිය යටතේ එහි සංවර්ධන කටයුතු සඳහා රු.මිලියන 40ක මුදලක් වෙන් කර ඇත.නමුත් එම භූමියේ අයිති
මඩොල්සීම වැවිලි සමාගම සතු වන බැවින් එම සංවර්ධන කටයුතු ආරම්භ කිරීම සඳහා එම සමාගමෙහි අනුමැතිය ලබා ගැනී
සඳහා යොමු කළ අතර එහිදී සමාගම් අංක 6/සං/09/2022 හා 2023/01/17 දිනැති ලිපිය මගින් එම සංවර්ධන කටයුතු ක්‍රියාත්ම
කිරීමට අදාල පැහැදිලි සැලැස්මක් ඉදිරිපත් කරන ලෙසත් ඉන් අනතුරුව ඒ සඳහා අනුමැතිය ලබා දෙන බවට දන්වා ඇත. ඒ
සංවර්ධන කටයුතු සඳහා ඔවුන්ගේ භූමිය භාවිතා කිරීම වෙනුවෙන් ප්‍රවේශපත් ගාස්තුවෙන් 30% ක නොඅඩු කොමිස් මුදල
ඔවුන් වෙත ලබාදෙන ලෙසත් ඉල්ලීමක් සිදු කර ඇත.
ඒ අනුව පුංචි ලෝකාන්තයේ පැහැදිලි සැලැස්ම සකස් කර ගැනීමට හා සංවර්ධන කටයුතු අවසන් වීමෙන් පසු ප්‍රවේශප
ගාස්තුවෙන් 30%ක මුදලක් ඔවුන් වෙත ලබාදීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**පුංචි ලෝකාන්තය සංචාරක ස්ථානය මේ වන විට මීගහකිවුල ප්‍රාදේශීය සභාව යටතේ පාලනය වන අතර LDSP ව්‍යාපෘතිය යටතේ සංවර්ධන කටයුතු සඳහා රු.මිලියන 40ක මුදලක් වෙන් කර ඇත.නමුත් එම භූමියේ අයිතිය මඩොල්සීම වැවිලි සමාගම සතු වන බැ එම සංවර්ධන කටයුතු ආරම්භ කිරීම සඳහා එම සමාගමෙහි අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කළ අතර එහිදී සමාගම් අ 6/සං/09/2022 හා 2023/01/17 දිනැති ලිපිය මගින් එම සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට අදාළ පැහැදිලි සැලැස්මක් ඉදිරිපත් ක ලෙසත් ඉන් අනතුරුව ඒ සඳහා අනුමැතිය ලබා දෙන බවට දන්වා ඇත. එම සංවර්ධන කටයුතු සඳහා ඔවුන්ගේ භූමිය භාවිතා කිරි වෙනුවෙන් ප්‍රවේශපත් ගාස්තුවෙන් 30% ක නොඅඩු කොමිස් මුදලක් ඔවුන් වෙත ලබාදෙන ලෙසත් ඉල්ලීමක් සිදු කර ඇත. ඒ අනුව පු ලෝකාන්තයේ පැහැදිලි සැලැස්මක් නිර්මාණය කර ගැනීමට හා සංවර්ධන කටයුතු අවසන් වීමෙන් පසු ප්‍රවේශපත් ගාස්තුවෙන් 30% මුදලක් ඔවුන් වෙත ලබාදීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතු යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, එම යෝජනාව ඒකමතිකව සභා සම් වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළඟට න්‍යාය පත්‍රානුකූලව කාරක සභා වාර්තා සලකා බැලීම සම්බන්ධයෙන් 2023.02.01 වන දින මුදල් කමිටු වාර්තාව ඉදිරිපත් කිරි කටයුතු කරන ලදී.

## <u>2023/02/01 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී පැවති</u>
## <u>මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව</u>

2023/02/01 වන දින පෙ.ව.09.00ට ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානා මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.පත්මා කුමාරි මැතිණිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා, ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.බාලසුන්දරම් මැතිතුමා, ලේකම්තුමිය හා විෂය නිලධාරි පිළිගනිමින් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව ආරම්භ ක ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව ගරු සභාපතිතුමා විසින් 2023/01/02 දිනැති පසුගිය රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී. පසු රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා යෝජනා කළ අතර එම යෝජ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා ස්ථිර කළේය.

න්‍යාය පත්‍රානුකූලව දිනට නියමිත කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් පළමු කරුණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 2023 ජනවාරි මස ආදායම්, වියදම් හා ඉන්ධන වාර්තා කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කළ අතර, 2023 වර්ෂයේ ජනවාරි මස ආදායම්, වියදම් හා ඉන්ධන වාර්තා අනුමත කිරීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් පළමු කරුණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අනුව මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් UPPE-5483 නිළ කැබ් රථය සඳහා 2023 ජනවාරි මස අනුමත ඉන්ධන සීමාව ඉක්මවා වැය කළ අමතර ඉන්ධන ලීටර් 165 සඳහා අනුමත කිරීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

දිනට නියමිත කරුණු අවසන් බැවින් හා සාකච්ඡා කිරීමට වෙනත් කාරණා නොමැති බැවින්, ගරු සභාපතිතුමාගේ ස්තුති කතාවෙන් අනතුරුව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව පෙ.ව.10.00ට අවසන් කරන ලදී.

මුලාසනය සභාව අමතමින්, මීළගට න්‍යාය පත්‍රාණුකූලව 2023 ජනවාරි මස ආදායම්,වියදම් වාර්තා හා සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තා සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

**<u>මාසික ලැබීම් සාරාංශය</u>**

**<u>මීගහකිවුල ප්‍රාදේශීය සභාව</u>**

මාසය - **2023** ජනවාරි

| ආදායම් ශීර්ෂය | ආදායම් ප්‍රභවය | මුදල (රු) |
|---|---|---|
| 1/71 | වැටුප් ප්‍රතිපූර්ණය | 2,008,093.81 |
| 1/71 | මන්ත්‍රී දීමනා | 540,000.00 |
| 1/13 | ව්‍යාපාර බදු | 78,000.00 |
| 1/62 | පෝරම ගාස්තු | 985.00 |
| 1/64 | සේවක ණය පොළී | 66.42 |
| 1/41 | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 4,000.00 |
| 1/44 | වීථි රේඛා හා නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම | 2,750.00 |
| 1/47 | වාහන නවතා තැබීමේ ගාස්තු | 9,350.00 |
| 1 | සේවක ණය | 5,422.32 |
| 1 | තැම්පත් | 145.00 |
| 2/12 | කර්මාන්ත බදු | 13,200.00 |
| 2/23 | පොදු පහසුකා මධ්‍යස්ථානය | 12,120.00 |
| 2/31 | බලපත්‍ර ගාස්තු | 55,250.00 |
| 2/62 | පෝරම ගාස්තු | 680.00 |
| 2 | තැන්පත් (වෙළඳ බලපත්‍ර) | 5,525.00 |
| 3/22 | තාවකාලික කඩ ලැබීම් | 9,000.00 |
| 3/21 | සභාව සතු ඉඩම් හා කුළී | 1,200.00 |
| 3/23 | ටෙන්ඩර් කඩ කුලී | 76,550.00 |
| 4/14 | ජල ලැබීම් | 41,574.00 |
| 6/15 | සභාව සතු ඉඩම් හා කුළී (පිටමාරුව පුංචි ලෝකාන්තය) | 10,000.00 |
| 6/62 | අබලි ද්‍රව්‍ය විකිණීම /පුස්තකාල පෝරම ගාස්තු | 250.00 |
| 5/23 | සතිපොළ ගාස්තු ලැබීම් | 10,810.00 |
| 173 | අත්තිකාරම් පියවීම | 800.00 |
| **වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට දීම** | | |
| 1/46 | ජල බවුසරය කුලියට දීම | 12,000.00 |
| 3/43 | බැකෝ යන්ත්‍රය කුළියට දීම | 23,125.00 |
| 3/43 | ටොන් 8 ගල්රෝල කුලියට දීම | 161,700.00 |
| **එකතුව** | | **3,082,596.55** |

## 2023 ජනවාරි මස ගෙවීම් විස්තරය - මීගහකිවුල ප්‍රාදේශීය සභාව

| අනු අංකය | ගෙවන ලද දිනය | ගෙවීම්ලාභී නම හා විස්තරය | මුදල (රු) |
|---|---|---|---|
| 1 | 2023.01.02 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2023/01/03 දින පැවැත්වෙන මහ සභාවට සංග්‍රහ වියදම් දැරීම වෙනුවෙන් අත්තිකාරම් මුදලක් ලබා ගැනීම. | 10,000.00 |
| 2 | 2023.01.02 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2023 වර්ෂය සඳහා සුළු මුදල් අග්‍රිමය ලබා ගැනීම. | 5,000.00 |
| 3 | 2023.01.03 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2023 ජනවාරි මස මුදල් හා ප්‍රතිපත්ති කමිටු දීමනා ගෙවීම. | 2,500.00 |
| 4 | 2023.01.03 | මන්ත්‍රී දීමනා - 2023 ජනවාරි මස | 294,000.00 |
| 5 | 2023.01.10 | ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් ප්‍රයිවට් ලිමිඩට්, 90 යූනියන් ප්ලේස්, කොළඹ 02 - ඡායා පිටපත් යන්ත්‍රයේ 2023 ජනවාරි මස 31 දින සිට 2024 ජනවාරි මස 30 දින දක්වා සේවා ගාස්තු ගෙවීම. | 21,086.40 |
| 6 | 2023.01.11 | ආර්.එම්.චන්ද්‍රවංශ මයා, ජයසංඛ ඔටෝ ඉලෙක්ට්‍රිකල්ස්, 19 කණුව, දූම්වැටි කඳුර, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 252-6368 කැබ් රථයේ මෝටර් බුෂ් සෙට් මෝටරය ගලවා බුෂ් පාස්සා මෝටරය අලුත් වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 4,850.00 |
| 7 | 2023.01.12 | කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා ලද යන්ත්‍ර සහයක සහ යන්ත්‍ර ක්‍රියාකරු වැටුප් ගෙවීම 2022 දෙසැම්බර් මස | 79,503.11 |
| 8 | 2023.01.12 | ආදේශක වැටුප් 2022 දෙසැම්බර් මස වැටුප් ගෙවීම. | 74,537.00 |
| 9 | 2023.01.12 | ඩබ්.කේ.එච්.නුවන්, 2022 දෙසැම්බර් මස පුංචි ලෝකාන්තයේ මුරකරු/මුදල් අයකැමි ලෙස සේවය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 17,289.00 |
| 10 | 2023.01.12 | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 001100109026659 දරණ ගිණුමට බැර - 2019 සැප්තැම්බර් මස සිට 2022 ජූනි මස දක්වා පළාත් පාලන විශ්‍රාම වැටුප් හිඟ දායක මුදල් ගෙවීම. | 38,474.[illegible] |
| 11 | 2023.01.23 | එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා, ගරු සභාපති - පළාත තුළ හා කොළඹ රාජකාරියට යාම වෙනුවෙන් 2023 ජනවාරි මස ගමන් වියදම් ගෙවීම. | 18,000.00 |
| 12 | 2023.01.23 | ඒ.එම්.විජිත ප්‍රියන්ත මයා, රියදුරු - ගරු සභාපතිතුමා සමඟ පළාත තුළ හා කොළඹ රාජකාරියට යාම වෙනුවෙන් 2023 ජනවාරි මස ගමන් වියදම් ගෙවීම. | 11,900.00 |
| 13 | 2023.01.23 | ආදායම් ගණකාධිකාරී(උප), ලංකා විදුලිබල මණ්ඩලය, අංක 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 2022 නොවැම්බර් මස මීගහකිවුල ජල පොම්පාගාරයේ විදුලි බිල්පත් පියවීම. | 15,692.79 |
| 14 | 2023.01.23 | ඩී.එම්.සංජීව නුවන්(ආදේශක) රියදුරු - 2022 දෙසැම්බර් මස කාර්යාලයේ සේවය කිරීම වෙනුවෙන් ගෙවීම. | 18,524.81 |
| 15 | 2023.01.25 | කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම 2023 ජනවාරි මස | 1,905,046.61 |
| 16 | 2023.01.25 | නව අභ්‍යාසලාභී උපාධිධාරී වැටුප් - 2023 ජනවාරි මස එස්.එම්.නවෝදා දිලිනි මෙයගේ වැටුප් ගෙවීම. | 44,875.00 |
| 17 | 2023.01.25 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම. | 4,935.00 |
| 18 | 2023.01.26 | මණ්ඩලික කාර්ය මණ්ඩල නිලධාරී වැටුප් - 2023 ජනවාරි මස ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙය, සභා ලේකම් වැටුප් ගෙවීම. | 56,848.70 |
| 19 | 2023.01.26 | කළමනාකරු, තව්දූ පොත්හල, මීගහකිවුල - මීගහකිවුල, කළුගහකඳුර, පිටමාරුව පුස්තකාල සඳහා නොවැම්බර් මස පුවත්පත් බිල්පත් පියවීම. | 23,050.00 |
| 20 | 2023.01.26 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - අප සභාව සතු 252-6368 දරණ කැබ් රථය සඳහා දූම් වාර්තාව හා ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලබා ගැනීම. | 15,000.00 |
| 21 | 2023.01.30 | ඩී.එම්.ආර්.යූ.දිසානායක මයා, ලංකා ඉන්ධන පිරවුම්හල, 14 කණුව, මීගහකිවුල - අප සභාව සතු රථ වාහන සඳහා 2023 ජනවාරි මස 01 සිට 15 දක්වා ඉන්ධන සඳහා මුදල් ගෙවීම. | 189,580.00 |
| | | මුළු එකතුව | **2,850,694.67** |

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

**වාහන සඳහා ලබා ගත් ඉන්ධන බිල්පත් පියවීමේ සාරාංශය**

**2023 ජනවාරි මාසය 01 වැනිදා සිට 30 වැනිදා දක්වා**

**2023.01.30 දිනට ඉන්ධන වියදම ( රුපියල් )** **412,330.00**

බිල්පත සකස් වී ඇති ආකාරය

| අ/අං | වාහන විස්තරය | ඉන්ධන වියදම ( රුපියල්) | ඉන්ධන ප්‍රමාණය | ඔයිල් ප්‍ර[illegible] |
|---|---|---|---|---|
| 1 | UP PF 5485 කැබ් රථය | - | - | |

| | | | | |
|---|---|---|---|---|
| 2 | 252-6368 කැබ් රථය | 51,000.00 | 125 | 0 |
| 3 | UP PE 5483 | 229,125.00 | 565 | 0 |
| 4 | 252-6368 කැබ් රථය සඳහා ඔයිල් | 3,480.00 | | 1 |
| 5 | UP LL 7774 කෲෂ කැබ් රථය | - | - | 0 |
| 6 | RD 6200 ට්‍රැක්ටර් රථය | 54,675.00 | 135 | 0 |
| 7 | RD 9389 ට්‍රැක්ටර් රථය | 40,500.00 | 100 | 0 |
| 8 | 270-1735 ට්‍රැක්ටර් රථය | - | - | 0 |
| 9 | YTS TON 02 ගල් රෝල | - | - | 0 |
| 10 | YTS TON 08 ගල් රෝල | - | - | 0 |
| 11 | වල් කපන යන්ත්‍රය සඳහා පෙට්‍රල් | 3,700.00 | 10 | 0 |
| 12 | වල් කපන යන්ත්‍රය සඳහා 2T ඔයිල් | 1,500.00 | | 1 |
| 13 | RX 1456 ජල මෝටරය | - | - | |
| 14 | ZA 5003 බැකෝ යන්ත්‍රය | 28,350.00 | 70 | |
| | **මුළු ඉන්ධන වියදම ( රුපියල් )** | **412,330.00** | **1,005** | **2** |

භාවිතා කළ ඉන්ධන විස්තර සාරාංශය

| | |
|---|---|
| ගරු සභාපතිතුමන්ගේ රාජකාරි සඳහා කැබ් රථ වෙනුවෙන් ඉන්ධන ලීටර් | 565 |
| කාර්යාලීය රාජකාරි සඳහා කැබ් රථ වෙනුවෙන් ඉන්ධන ලීටර් | 125 |
| කාර්යාලීය අනෙකුත් වාහන සහ යන්ත්‍ර සඳහා ඉන්ධන ලීටර් | 315 |
| 252-6368 කැබ් රථය සඳහා එන්ජින් ඔයිල් | 1 |
| වල් කපන යන්ත්‍රය සඳහා 2T ඔයිල් | 1 |
| **2023.01.15 දිනට භාවිතා කළ මුළු ඉන්ධන ලීටර්** | **1,007** |

**UP PE 5483 කැබ් රථය**

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු ) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | 2023.01.02 | 758100 | 20 | 420.00 | 8,400.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි |
| 2 | 2023.01.03 | 758052 | 65 | 405.00 | 26,325.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි (කොළඹ) |
| 3 | 2023.01.09 | 758057 | 30 | 405.00 | 12,150.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි සඳහා 2023.01.05 දින ලබා ගත් ඉන්ධන සඳහා ගෙවීම |
| 4 | 2023.01.09 | 758058 | 50 | 405.00 | 20,250.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි |
| 5 | 2023.01.13 | 758062 | 30 | 405.00 | 12,150.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි සඳහා 2023.01.10 දින ලබා ගත් ඉන්ධන සඳහා ගෙවීම |
| 6 | 2023.01.13 | 758063 | 15 | 405.00 | 6,075.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි |
| 7 | 2023.01.17 | 758065 | 65 | 405.00 | 26,325.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි සඳහා 2023.01.15 දින ලබා ගත් ඉන්ධන සඳහා ගෙවීම ( නිවටඹුව ) |
| 8 | 2023.01.17 | 758066 | 50 | 405.00 | 20,250.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි |
| 9 | 2023.01.24 | 758072 | 65 | 405.00 | 26,325.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි සඳහා 2023.01.20 දින ලබා ගත් ඉන්ධන සඳහා ගෙවීම ( කොළඹ ) |
| 10 | 2023.01.24 | 758073 | 50 | 405.00 | 20,250.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි සඳහා 2023.01.22 දින ලබා ගත් ඉන්ධන සඳහා ගෙවීම |
| 11 | 2023.01.26 | 758075 | 65 | 405.00 | 26,325.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි |
| 12 | 2023.01.30 | 758027 | 60 | 405.00 | 24,300.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි සඳහා 2023.01.29 දින ලබා ගත් ඉන්ධන සඳහා ගෙවීම |
| | එකතුව | | **565** | | **229,125.00** | |

**252-6368 කැබ් රථය**

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු ) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | 2023.01.02 | 758051 | 25 | 420.00 | 10,500.00 | කාර්යාලී රාජකාරි සඳහා |
| 2 | 2023.01.05 | 758056 | 20 | 405.00 | 8,100.00 | කාර්යාලී රාජකාරි සඳහා |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3 | 2023.01.13 | 758061 | 20 | 405.00 | 8,100.00 | කාර්යාලී රාජකාරි සඳහා |
| 4 | 2023.01.18 | 758068 | 30 | 405.00 | 12,150.00 | කාර්යාලී රාජකාරි සඳහා |
| 5 | 2023.01.25 | 758074 | 30 | 405.00 | 12,150.00 | කාර්යාලී රාජකාරි සඳහා |
| එකතුව | | | **125** | | **51,000.00** | |

**252-6368 කැබ් රථය**

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | එන්ජින් ඔයිල් | ඒකක මිල ( රු) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | 2023.01.04 | 758053 | 2 | 1,740.00 | 3,480.00 | රථයට අවශ්‍ය එන්ජින් ඔයිල් |
| එකතුව | | | **2** | | **3,480.00** | |

UP LL7774 කෘෂ කැබ් රථය

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | - | |
| එකතුව | | | | | - | |

RD 6200 ට්‍රැක්ටර් රථය

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | 2023.01.10 | 758059 | 35 | 405.00 | 14175.00 | කසළ හා ජල බවුසරයේ රාජකාරි |
| 2 | 2023.01.19 | 758069 | 30 | 405.00 | 12150.00 | කසළ හා ජල බවුසරයේ රාජකාරි |
| 3 | 2023.01.24 | 758071 | 35 | 405.00 | 14175.00 | කසළ හා ජල බවුසරයේ රාජකාරි |
| 4 | 2023.01.27 | 758026 | 35 | 405.00 | 14175.00 | කසළ හා ජල බවුසරයේ රාජකාරි |
| එකතුව | | | **135** | | **54675.00** | |

RD 9389 ට්‍රැක්ටර් රථය

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | 2023.01.04 | 758054 | 35 | 405.00 | 14,175.00 | කසළ එකතු කිරීම හා බැහැර කිරීමේ රාජකාරි |
| 2 | 2023.01.12 | 758060 | 35 | 405.00 | 14,175.00 | කසළ එකතු කිරීම හා බැහැර කිරීමේ රාජකාරි |
| 3 | 2023.01.23 | 758070 | 30 | 405.00 | 12,150.00 | කසළ එකතු කිරීම හා බැහැර කිරීමේ රාජකාරි |
| එකතුව | | | **100** | | **40,500.00** | |

**වල් කපන මැෂිම**

| ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය (ලීටර්) | | ඒකක මිල (රු) | | මුළු වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|
| | | පෙට්‍රල් | ඔයිල් | පෙට්‍රල් | ඔයිල් | |
| 2023.01.04 | 758055 | 10 | 1 | 370.00 | 1,500.00 | 5,200.00 |
| එකතුව | | **10** | **1** | 370.00 | 1,500.00 | **5,200.00** |

ZA 5003 බැකෝ යන්ත්‍රය

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | 2023.01.17 | 758064 | 40 | 405.00 | 16,200.00 | 14 කණුව ප්‍රදේශයේ මුදල් ගෙවන ල[illegible] වැඩකට යාම සඳහා |
| 2 | 2023.01.17 | 758067 | 30 | 405.00 | 12,150.00 | නාය යෑමකින් මාර්ගයට වැටී තිබූ පස් ඉවත් කිරීම සඳහා |
| එකතුව | | | **70** | | **28,350.00** | |

**270-1735 ට්‍රැක්ටර් රථය**

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | - | |
| එකතුව | | | **0** | | **-** | |

**YTS TON 02 ගල් රෝල**

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | - | |
| එකතුව | | | 0 | | - | |

**YTS TON 08 ගල් රෝල**

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | - | |
| එකතුව | | | 0 | | - | |

**2023 ජනවාරි මස ආදායම්, වියදම් වාර්තා හා සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තාව සම්මත කිරීමට සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.පත්මා කුමාරි මැතිණිය ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා හා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතවය මත, 2023 ජනවාරි මස ආදායම්, වියදම් වාර්තා හා සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

<u>**ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස්**</u>

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.පත්මා කුමාරි මැතිණිය**</u>

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.පත්මා කුමාරි මැතිණිය සභාව අමතමින්, මම යෝජනාවක් වශයෙන් කරනවා අපේ ප්‍රාදේශීය සභාව තුළ කාන්තා හා ළමා කමිටුව තියෙනවා. ඒ කමිටුව සඳහා වෙන් කරන මුදලෙන් මේ සභාව තුළ හදන්න පොඩි කුටියක් විදිහට, සභාවට එන ගර්භණී අම්මලා, ළමයි අරගෙන එහෙම එන අම්මලාට, කිරි දෙන මව්වරුන්ට, දරුවාට කිරි ටිකක්වත් දෙන්න පුළුවන් විදිහට. පොඩි කොටසක් වෙන් කරලා හදන්න, ඒ මුදලෙන් ඒක හදන්න සුදුසු යැයි මම යෝජනා කරනවා. අපි යම් තැනකට ගියත් කියනවා සභාවෙන් මේ දේ හරි කරලා තියෙනවද කියලා, ඒක වෙන්නත් ඕන දෙයක් ඇත්තටම.

මූලාසනය සභාව සභාව අමතමින්, අපි ඉන්නත් පුළුවන්, නැති වෙන්නත් පුළුවන්. නමුත් ඔබතුමිය කියපු කතාව හරි. වර්ල්ඩ් විෂන් ආයතනයත් එක්ක ඔබතුමිය සම්බන්ධතාවයක් තියෙනවා. අපිට පුළුවන් නම් ප්‍රතිපාදන ලබලා දෙන්න, අපි ඒ වැඩේ කරලා දෙන්නම්.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.පත්මා කුමාරි මැතිණිය සභාව අමතමින්, අපෙන් ඉල්ලීමක් කරන්න ඕන. ඒක අනිවාර්යෙන්ම කරන්න සුදුසු යැයි මම යෝජනා කරනවා. බොහොම ස්තූතියි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා**</u>

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා සභාව අමතමින්, මං හිතන්නේ වසර පහක් මේ සභාවේ සහෝදරත්වයෙන් එකමුතුව සියලු දෙනාම කොට්ඨාසය වෙනුවෙන් රටේ තිබුණ දැඩි ආර්ථික අවපාතයට මුහුණ දෙමින් අපිට පුළුවන් විදියට, අපේ පක්ෂ, දේශපාලනය මොනවා උනත් රට වෙනුවෙන් හරි දේශය වෙනුවෙන් හරි එකතු වෙලා සභාපතිතුමා එක්ක යම්කිසි ගමනක් ගියා. අද වන විට රටේ තියෙන නීත්‍යානුකූල තත්ත්වයත් එක්ක, රටේ තියෙන ආර්ථික හා සමාජීය පසුබිම කෙසේ වෙතත් නීත්‍යානුකූල පදනම මත මැතිවරණ කොමිසම යම් කිසි විදිහකින් මැතිවරණය කැඳවලා තියෙනවා. එවැනි අවස්ථාවක අපි මේ සභාවේ මන්ත්‍රීවරු 17න් තරග කරන්නේ නැත්තේ උඩලකුඹුර මන්ත්‍රීතුමත්, ශ්‍රියාණි මන්ත්‍රීතුමියත් විතරයි මම දන්න හැටියට. ඉතිරි අය ඔක්කොම කුමන හෝ දේශපාලන පක්ෂයකින් තරග කරනවා. මං මේ අවස්ථාවේ දී සහෝදරත්ව බැඳීම ඉදිරි වසර පහටත් ගෙන යන්න අපි සියලු දෙනාටම සුභාශිංශනය ගෙන එනවා. සියලු දෙනාටම තම තමන්ගේ ජයග්‍රහණය කරලා මේ වගේ අත් වැල් බැඳගෙන ඉදිරි වසර පහ ගමනක් යන්න සියලු දෙනාටම ශක්තිය ධෛර්යය වාසනාව ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම මැතිවරණය පවත්වයිද නොපවත්වයි කියන එක තීරණය කරන්න බැහැ. ඉදිරියේදී මැතිවරණය පවත්වන, නවත්වන මැතිවරණ කොමිසම තීන්දු කරයි. ඒක රජයටවත්, ජනාධිපතිටවත් නෙවේ,ඒකෙ ඇත්තම කතන්දරේ නම් මැතිවරණ කොමිසමත්, අධිකරණයත් තමයි ඒ වැඩ පිළිවෙළ විසඳලා දෙන්න ඕන. ඒක ඒ ආකාරයෙන් ඉෂ්ට සිද්ධ වෙයි. මම වැඩි දුරටත් කතා කරන්න යන්නේ නැහැ. අසනීප තත්ත්වයේ ඉදිද්දිත් මං මේ ස්ථානයට ආවේ සභාවට සම්බන්ධ වීම අවශ්‍ය නිසා. සියලු දෙනාටම නැවත වරක් සුභාශිංශනය එක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි. ජය වේවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා**</u>

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා සභාව අමතමින්, මේ මොහොත වෙනකොට වර්ෂාපතනය ඇද හැලෙනවා. ඒත් යම් යම් අවස්ථාවලට මුහුණ දෙනවා. කොහොම නමුත් මං හිතනවා අපිට මේ සභා කටයුතුවල අවසාන සභා වාරය වෙන්නත් පුළුවන්. අපි ඒ ගැන සිහියේ තියා ගෙන අපි දකිනවා මේ අවුරුදු පහ ඇතුළත අපිට යම් යම් ප්‍රමාණයකින් හෝ ජනතාවගේ පැත්තේ ඉඳලා යම් යම් තීන්දු තීරණ අරගෙන, අපි යම්තාක් දුරට හෝ ඔවුන්ගේ ප්‍රශ්න වලට මැදිහත් වීමක් කරා. යම් විසඳුම් ප්‍රමාණයක් ගන්න හැකියාව ලැබුණා. හැබැයි ඒත් එක්කම අපි දකිනවා යම් යම් ප්‍රමාණයකින් විසඳුණු අවස්ථාවලට ඒක තව ටිකක් දිගුවක් විදිහට තව තවත් ඔවුන්ගේ ජීවිත අභ්‍යන්තරයට දැනෙන්න වැඩපිළිවෙළක් දැනෙන්න යම් මෙහෙවරක් කරන්න අවස්ථාව විවර කර ගන්න පුළුවන්කමක් තිබුණා කියලා. එහෙම කියන්නේ අද දවසේ අපි යම්තාක්ද දුරකට හරි අපි මන්ත්‍රීවරයෙක් වශයෙන් ගන්නා වූ තීරණත් එක්ක මං හිතනවා කොහේ හරි දෙයක් මේ සමාජයට වෙන්න ඇති. ඒකෙදි මේ ඉන්න පිරිසම තමයි කොටස්කරුවෝ. ඒත් එක්කම මම දකිනවා අපි මීට වඩා අපේ ක්‍රියාත්මක යාන්ත්‍රණය සහ සැලසුම් ප්‍රමාණය තව තවත් පවතින සමාජයට යාවත්කාලීන වෙන ක්‍රමවේදයකට අපි යා යුතුව තිබෙනවා. මොකද දැන් තියෙන සමාජ වටපිටාව ගත්තොත් අපිට හිතෙනවා අපි ආපස්සට හැරිලා බැලුවොත් වේගයෙන් තාක්ෂණයත් එක්ක එකතු වෙන සමාජයක් කියන එක අපේ බොහෝ අංශ ප්‍රමාණයක් දැන් තාක්ෂණයත් එක්ක එකතු වෙලා තිබෙන්නේ. ඉතින් ඒකත් එක්ක අපේ සභාපතිතුමා කිව්වා මේ සභාවේ ස්ථාපිත කරනවා කියලා ඉ- පුස්තකාලයක්. ඇත්තටම ඒක සන්තෝෂ වෙන්න ඕන කාරණයක්. මං හිතනවා අනිත් ඒවා කෙසේ වෙතත් ඒ දේම මේ බිමේ කරා නම් ඒක ගොඩක් වටිනවා. මොකද ඒ වටිනා අවස්ථාව ලැබෙන්නේ අපේ මේ ප්‍රදේශයේ ඉන්න දරුවො ටිකට. ඉතිං ඒ දේ කරන්න අවස්ථාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒත් එක්කම ගත්තම අපි දැන් මේ වෙනකොට සමාජයේ යම්කිසි කතා බහක් ඇති වෙලා තියෙනවා නැවතත් මැතිවරණ කාල රාමුවකට. දැන් අපි සමස්ත සමාජයම වෙන් වෙලා තියෙනවා. මිනිස්සුන්ගේ යම්කිසි දේශපාලන මුහුණුවරක් ගන්නා අදහස් ප්‍රමාණයක් මේ සමාජයට මුදා හරින්න. ඒකෙදි මම දකිනවා පුද්ගල චරිත ඝාතනවලට වඩා අපි අපේ ප්‍රතිපත්ති රාමු තුළ

බෝගහකුඹුර මාර්ගය ලක්ෂ හයක්, මොරහෙල විද්‍යාලයේ පඩිපෙළට ලක්ෂ පහක්, ගල් කැටියා මාර්ගය ලක්ෂ පහක්, මොරහෙළ ප්‍රජා ශාලාවට ලක්ෂ දාසයක්, මොරහෙල විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමට ලක්ෂ දහයක් ඒ වගේම අපේ ආණ්ඩුවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නිවාස හතරක් කැටවත්ත මොරහෙල වසම් දෙකට ඒ වගේම බහු කාර්ය සංවර්ධන බහු කාර්ය රැකියා ලක්ෂයේ ව්‍යාපෘතිය යටතේ රැකියා හයක් මොරහෙල ගම්මානයටත් කැටවත්ත මොරහෙල ග්‍රාම සේවා වසම් දෙකටත් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේත් පොහොට්ටුවෙන් අපිට ගෙනත් දෙන්න පුළුවන් වුණා. කාලයක ඇවෑමෙන් අපේ මිනිස්සුන්ට ඇත්ත පේන් නැති ලෝකයක මම හිතන්නේ අඳුරේ අතපත ගාලා, නොයෙකුත් දේශපාලන අරමුණු කරා මේ මිනිස්සු ගමන් කරන යුගයක හේතුව තමයි ඉහල දේශපාලන අධිකාරිය. මම හිතන්නේ අපිට පක්ෂ මාරු කරන්න තිබ්බා, පාට මාරු කරන්න තිබ්බා, අපිට වෙනත් පක්ෂ නියෝජනය කරන්න තිබ්බා. නමුත් වැදූ අම්මත් හැදූ තාත්තා අමතක නොකරන පිරිසක් විදිහට අපි සිංහලයෝ හෙලයෝ විදිහට ගෞරවණීය සභාවේ දී අවසානයේ පොහොට්ටුව වෙනුවෙන් දේශපාලනය නියැලෙන්නට පොහොට්ටුව නියෝජනය කරලා මේ පාර මැතිවරණයටත් ඉදිරිපත් පෙන්නටත් මම හා ඔබතුමා ඇතුළු අපේ ගෞරවනීය මන්ත්‍රී මණ්ඩලයේ තීරණය කරා. ඉතින් ඒ තුළ දී මම කියන්න කැමතියි ගමේ සංවර්ධනයට ප්‍රාදේශීය සභාවකින් විය යුත්තේ ගමේ සංවර්ධනය ප්‍රදේශයේ සංවර්ධනය සඳහා මේ කොට්ඨාසය ඇතුළෙ කොට්ඨාස නියෝජනය කරන කොට්ඨාසයට වැඩ කරන්න පුළුවන් ගමට වැඩ කරන්න පුළුවන් ගරු මන්ත්‍රීවරයෙක් ප්‍රාදේශීය සභාවකට යොමු කරනවා. ඒක තමයි ප්‍රධාන අරමුණ මේ තුළින් අපිට ජාතික දේශපාලනය වෙනස් කරන්න බැහැ, ජාතික දේශපාලනය එදා ගරු නිමල් මන්ත්‍රීතුමා උඩලකුඹුර මන්ත්‍රීතුමා ඔබතුමා මේ සභාවේ සියලු දෙනා අපේ කොට්ඨාස මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු වලින් ස්වංපෝෂිත කරා. එදා පොහොර ප්‍රශ්නයේදී අපි හැමවෙලේම හඬ නැගුවා මේක සුදුසු නැහැ, ඒක කළ යුතු නැහැ කියලා. නමුත් ඒ හඬට ඇහුම්කන් දෙන්නට ජාතික දේශපාලනය නොහැකි  වුණා. ඉතින් අපි අපිට පුළුවන් දේ තමයි කරන්න ඕන, ඇත්තටම සභාවකින් කරන්න පුළුවන් ගමට වැඩක් කරන එක. ඒ නිසා ජාතික දේශපාලනය වෙනස් කරන එක නෙමෙයි. ඉතින් සතුටු වෙනවා පුද්ගලිකව රට කොරෝනා ව්‍යවසනයෙන් දුක් විඳිද්දී පුද්ගලික වියදමෙන් සියලුම නිරෝධායන පවුල් සඳහා මම හිතන්නේ මේ මන්ත්‍රීවරු සියලු දෙනා ඒ දායකත්වය දැක්වුවා. පුද්ගලික වියදමෙන් ඔවුන් ඒ ඒ පවුල් සඳහා ද්‍රව්‍ය ආධාරවලින් සහයෝගය දැක්වූ අය වගේම මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ නායකත්වයෙන් අපිට පුද්ගලිකව ඒ මිනිසුන්ට සහයෝගයක් දක්වන්න පුළුවන් වුණා. මේ ඉදිරියේ එන පළාත් පාලන මැතිවරණය ප්‍රකාශ කරල තියෙන්නෙ මාර්තු 9 වැනිදා. එදා අපේ මේ සභාව නියෝජනය කරාට 2018දී ඉදිරියේදී කවුරු කොතන මෙතන ඉඳගනීද දන්නෙ නැහැ. නමුත් මම කියන්න කැමතියි ගරු මන්ත්‍රීවරුන් ඒ ඔබ යම් යම් දේශපාලන පක්ෂ හොඹවනවා. මෙන්න මෙහෙම කතාවක් යනවා ඒක ඔබ ඔබගේ දේශපාලන පක්ෂය නියෝජනය කරන ඒ නායකයා දැනුවත් කරන්න මොකද නැත්නම් මේක දිලීරයක් වගේ විසබීජයක් වගේ පැතිරී යනවා. හේතුව තමයි අපි වැඩ කරා වැඩ කරද්දි ඔබතුමාට මතක ඇති ඔබතුමා දන්නවා පුද්ගලික වියදම වලින් අපි කොළඹ කීපාරක් ගිහිල්ලා ඇති ද කියලා. ඉතින් මේ ගමට සංවර්ධනය ගේන්න  ඔබතුමා කොතරම් කොළඹ ගිහිල්ලා ඇත්ද ඒ සඳහා ඔබට කිසිම මුදලක් වරප්‍රසාදයක් ලැබුණෙ නැහැ. මේ පාරවල් හදද්දි සංවර්ධනය වැඩ කරද්දි මම හිතන්නේ කිසිම මන්ත්‍රීවරයෙකුට ගමේ අදහසක් යනවා ප්‍රචාරයක් යනවා ගමේ හැම තැනම 15% 10% කොමිස් ලැබුණු මන්ත්‍රීවරුන් කියලා. අපි තේ එක දෙන්නත්, උත්සවය සංවිධානය කරන්නත්, කන්න බොන්න දෙන්නත්, අපේ පුද්ගලික වියදමෙන් තමයි අපි දැරුවේ. කවුරුත් කොතැනකදීවත් අපිට කිසිම මුදලක් දීලත් නැහැ. අරගෙනත් නැහැ. ඒ ගෞරවය අපේ තියනවා ඕනම තැනක දී ඕනම වෙලාවක දි අපට හඬ නගා කියන්න පුළුවන් අපි කාටවත් ඔලුව නවලා අපි පගා ගහලා කොමිස් ගහලා නැහැ කියලා. ඉතින් ඒ හින්දා ඒක ඔබ නියෝජනය කරන දේශපාලන පක්ෂයේ නායකයා ඔබයි. ඒ හින්දා ඔබ දැනුවත් කරන්න සභාවට ගිහිල්ලා මේ මන්ත්‍රීවරු එහෙම දෙයක් ලැබෙන්නෙත් නැහැ, ලැබුණෙත් නැහැ කියන එක. ඔබ මතක ඇතුව පුළුවන් නම් ඔබගේ සාමාජිකයන් දැනුවත් කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ වගේම මේ මැතිවරණයේදී මම ගොඩක් සතුටු වෙනවා පක්ෂ හයක් මීගහකිවුල හදන්න මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තරග කරනවා. ඉතින් මේ සභාව නියෝජනය කරන ඉදිරියේදී ඔබද මමද කවුද කියලා දන්නේ නැහැ. නමුත් මගේ කොට්ඨාසයේ නියෝජනය කරන්නට මාත් එක්ක තරග කරන්නට මගේ ආදරණීය ගරු මන්ත්‍රී නන්දන මන්ත්‍රීතුමා පැමිණිලා තියෙනවා. ඉතින් ගොඩක් සතුටුයි සුහදශීලී අපේ මිත්‍රයා. ඒ වගේම දේශපාලනට එහා ගිය සහෝදරකමක්. ඉතින් මම ආරාධනා කරනවා අපේ ජේවීපී සහෝදරයත් ඉන්නවා අපේ නාමල් මන්ත්‍රීතුමා ඔබගේ දේශපාලන පක්ෂය නියෝජනය කරල අපේ ගමේ අපේක්ෂකයා ඒ වගේම ස්වාධීන කණ්ඩායම් වලින් ඉදිරිපත් වන ඒ වගේම අපේ විපක්ෂ නායකතුමාගේන් ඉදිරිපත් වන ඒ සියලු අපේක්ෂකයන්ට ඔබ දැනුවත් කරන්න සුහදශීලීව මේ ගම හදන වැඩේට හැමෝම තමන්ගේ අරමුණු කර ගන්න. එහෙම නැතුව දේශපාලන මඩ ගැහීමකින් තොරව ඔබව තෝරාගනියි ගමේ මනුස්සයා ගමේ ඡන්ද දායකයා ඔබට ආදරය කරයි. ඉතින් ආදරය කරන පිරිසක් තමයි එක එක දේශපාලන පක්ෂ විසින් ගම නියෝජනය කරන්න පත් කරලා ඉන්නේ. මම මේ කැටවත්ත විතරක් මුල් තැන දෙනවා නෙවෙයි. පොදුවේ මීගහකිවුල බල ප්‍රදේශයටම ඔබ ගමට දාලා ඉන්නේ ආදරණීය නායකයෙක් ඔබගේ පක්ෂයේ. ඉතින් කාටවත් මඩ ගහන්නේ නැතුව ඔබගේ ආකල්පය හා ඔබගේ අරමුණ ඔබගේ දේශපාලන දැක්ම විතරක් ගැන කියන්න කියලා ඉල්ලීම කරනවා. එහෙමනම් මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපි සියලු දෙනාට ජය ප්‍රාර්ථනා කරනවා. විශේෂයෙන්ම මගේ ආදරණීය සහෝදරයා නන්දන මන්ත්‍රීතුමා කැටවත්තෙන් ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්නට වාසනාව ලැබෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි .

**මූලාසනය සභාව අමතමින් ප.ව.01.00ට ගරු මන්ත්‍රීවරුනි,මේ මහා සභාව විනාඩි 05කට අඩාලව කල් තැබීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා සභාපති එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා යෝජනා කරන අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, මහා සභාව විනාඩි 05කට අඩාලව කල් තැබීම සඳහා ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

**මූලාසනය සභාව අමතමින් ප.ව.01.05ට, විනාඩි 05කට අඩාලව කල් තැබූ මහා සභාව නැවත ආරම්භ කිරීම සඳහා ගරු ප්‍රාදේශීය සභා සභාපති එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, අඩාලව කල් තබන ලද සභාව මහා සභාවක් බවට පත් කිරීම ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

**අඩාලව කල් තැබීමෙන් පසු නැවත මහා සභාව ආරම්භ කිරීමේදී සියළු මන්ත්‍රීවරුන් සභා ගර්භය තුල සිටින ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එන්.එම්.නන්දන සම්පත් උදය කුමාර මැතිතුමා**

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එන්.එම්.නන්දන සම්පත් උදය කුමාර මැතිතුමා සභාව අමතමින්, පළවෙනිවතාවට මීගහකිවුල ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්න හැකියාව ලැබුණා 2016. එතකොට කිසිම අත්දැකීමක් නැතුව

අපිට දේශපාලනය යන්න ඇත්තටම මොකක්ද කියලා තේරුම් ගත්තේ ඒ අවස්ථාවේදී තේරුම් අරගෙන ගමට වැඩක් කරන්න කියලා තමයි මම සියලු දෙනාගෙන්ම උරෙන් උර ගැටී අපි කටයුතු කරේ. ඇත්තටම ඒ අවස්ථාවේදී අපට ලොකු සහයෝගයක් ලබලා දුන්නා ගරු සභාපතිතුමාගේ මූලිකත්වයෙන් සියලු මන්ත්‍රීවරුන්, උප සභාපතිතුමා, විපක්ෂ නායකතුමා, අනෙකුත් සියලු මන්ත්‍රීතුමන්ලා. ඔක්කොම එකතු වෙලා අපි ගමේ වැඩක් කරන්න අපි එදා ආරම්භ කරපු ගමන ඇත්තටම මං හිතන්නේ වසර 5 ක කාලයක මම පුද්ගලිකවම සභාපතිතුමාගේ හයියෙන් සහ මේ දුන්නා වූ දායකත්වයෙන් අපේ කොට්ඨාසයට විශාල වැඩක් කරා කියන්න මම පුද්ගලිකව සතුටු වෙනවා. ඔබ සියලු දෙනාටත් ස්තූතිවන්ත වෙන්න ඕන මොකද ඔබතුමාලාගේ හයියත් එක්ක සභාපතිතුමාට විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙනවා මම මේ අවස්ථාවේදී ඉතුරු කොටස ගත්තොත් චන්ද්‍රසිරි මන්ත්‍රීතුමාගේ, සභාපතිතුමාගෙන්, රංගන මන්ත්‍රීතුමා ඇතුළු සියලුම කොට්ඨාසවල වැඩ ඒ හා සමානම මං හිතනවා සභාපතිතුමා අපට ලබලා දුන්නා. එක එක වැඩ කරගෙන ගියා හැබැයි තව ටිකක් තියනවා කරගන්න ඒක සභාපතිතුමා ඒ ටිකත් කරල දෙන්නේ කියලා මම අවස්ථාවේ දී බැගෑපත්ව ඉල්ලනවා. මොකද තව පොඩි කෑල්ලක් කාපට් එක ගහන්න තියනවා. ඒක නිම කරලා දෙන්න කියලා ඉල්ලනවා. ඇත්තටම අපි දේශපාලනයට ඇවිල්ලා යමක් දැන ගෙන දේශපාලනය මොකක්ද කියන එක ගැන අපිට වැටහීමක් තියෙනවා. ඒත් අපි ඉදිරියට මේ පාර පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වෙලා තියෙනවා. ඔබ සියලු දෙනා ජයග්‍රහණය කරන්න කියලත් මං පුද්ගලිකව හදවතින් සුබ පතනවා. ඉදිරිපත් වෙන මන්ත්‍රීතුමන්ලාටත් ඇත්තටම අපි දේශපාලනයේ මං හිතන්නේ මෙතන ඉන්න චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා කිව්වා වගේ සීයට පහේ කොමිස් ගත්ත කෙනෙක් නෑ. නමුත් එහෙම මතයක් යනවා. ඒ කට්ටිය ඒ මතය දැරුවාට සියලු දෙනාගේ කටවල් වහන්නත් බැහැ ඒ කියන දෙයක් කියපුදෙන් තමන්ගේ හදවත දන්නවනේ. ඒ නිසා සියලු දෙනාටමත් ඒ අපි කොහෙ හරි ගියත්, වියදම් වුණත්, සභාපතිතුමා අතින් වියදම් වුණත් ගමට සංවර්ධනයක් වෙනවා නම් ඒ සියලුම දේ සංවර්ධනය කරා නම් අපි ගම වෙනුවෙන් කරේ. සමහරක් වෙලාවට අපේ හිත්වල කණගාටුව තියනවා චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා කිව්වා වගේ කාපට් එක වෙනත් කෙනෙකුට දෙන්න තිබ්බා නේද කියලා තවමත් කියනවා. අපි ඒක හැදුවේ අපි සතුටක් ලබන්න. අපිට ගමේ මිනිහෙකුට සහනයක් දෙන්න. නමුත් මිනිස්සු රැස්වීම් වලදී තවමත් කියන්න වචනයක් අපි සියලු දෙනාට නැති වෙන්න තියෙනවා. අපිට කොහෙන් හරි මඩ පහරක් හොයාගන්නවා. ඒකට චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා දුක් වෙන්නත් එපා. අපි දුක් වෙන්නෙත් නැහැ. චන්ද්‍රසිරි මන්ත්‍රීතුමාට, නන්දන මන්ත්‍රීතුමාට වෙච්ච අසාධාරණය. මම අපි දෙන්න එක කොට්ඨාස ඉල්ලුවත් මම ආරාධනා කරා. නමුත් මට කනගාටුවක් තියෙනවා අපි දෙදෙනාම දේශපාලනයට ආවේ කැටවත්ත කොට්ඨාසයෙන්. ඔබ දෙදෙනාම පැමිණෙන්න කියලා සුබ පතනවා. අනිත් එක මේ ප්‍රාදේශිය සභාවට ඇවිල්ලා අපි මන්ත්‍රීවරයෙක් විදියට වැඩ කරන කොට අපිට දැක්වූ සහයෝගයට ලේකම්තුමිය, හිටපු ලේකම්තුමාන්ලා, ලේකම්තුමිය කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටම ඇත්තටම නන්දන මන්ත්‍රීතුමා කිව්වා වගේ අපිට තේ පැන් සංග්‍රහය වුණත්, ඇල්වතුර එක පවා මෙතැනට දීලා ගමට ගිහිල්ලා පාරක් හරි පස් පිඩැල්ලක් හරි කැලයක් හරි සුද්ද කරල දුන්නා නම් ඒ සියලුම කම්කරුවන් විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙනවා. අපි වෙනුවෙන් ගිහිල්ලා අපේ ඉල්ලීම පස්සට දාන්නේ නැතුව සභාපතිතුමාගේ මූලිකත්වයෙන් ඒ සහය දුන්නට ගොඩක් ස්තූතිවන්ත වෙනවා. කතා කරන්න ගොඩක් දේවල් තිබුනත් අනිත් මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් දෙන්නත් ඕනි. මං හිතන්නේ අපි නැවතත් සියලු දෙනාට මම නැතුව හෝ කමක් නෑ ඔබ සියලු දෙනාම මේ ප්‍රාදේශීය සභාවට 2023 මැතිවරණය තිබුනොත් නාම යෝජනා කැඳවලා තියෙනවා. ඒ නිසා ඔබ සියලු දෙනාටම මේ ප්‍රාදේශීය සභාව පැමිණ සියලු දෙනාගේම සහභාගිත්වයෙන් සුහදත්වයෙන් වැඩ කටයුතු කරගෙන යන්න ශක්තිය ධෛර්යය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ශ්‍රියාලතා මැතිණිය

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ශ්‍රියාලතා මැතිණිය සභාව අමතමින්, 2018 දී පළාත් පාලන මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයෙන් කපිල මන්ත්‍රීතුමාත් මමත් බලගොල්ල කොට්ඨාසයෙන් තරග කරමින් ඇත්තෙන්ම අපි විශිෂ්ට ජයග්‍රහණයක් ලැබුවා. එක්සත් ජාතික පක්ෂයේ අපේ කොට්ඨාසයට සංවර්ධනය වෙන්න විශාල වැඩ කොටසක් කරා කපිල මන්ත්‍රීතුමාත් මමත් පක්ෂය වෙනුවෙන් පාක්ෂිකයන්ට ගමේ සියලුම දෙනාට එක හා සමානව වැඩ කරන්න සංවර්ධනය කරන්නත් යොමු කරා. මට මීගහකිවුල කොට්ඨාසය තරග කරන්න ලැබුණා. උපන් ගම මම කැමැත්තෙන් බාර ගත්තා ඉදිරියේදී මීගහකිවුල ශ්‍රියානි මන්ත්‍රීතුමියත් මට හයියක් වුණා. මේ ගම මීගහකිවුල වෙනුවෙන් යෝජනා වැඩක් කරන්න පුළුවන් හැමදෙයක්ම හොයලා බලලා ගම වෙනුවෙන් වැඩක් කරන්න කියලා හිතාගෙන මම ඇත්තෙන්ම ඉදිරිපත් වුණා. ශ්‍රියානි මන්ත්‍රීතුමිය තරඟ කරන අනෙකුත් හිටපු සභාපතිතුමාත් අපි තුන්දෙනාම මේ ගම වෙනුවෙන් වැඩක් කරමු කියලා හිතා ගැන සුහදශීලීව ගමන ආරම්භ කළත් අපිට පුළුවන් පක්ෂ භේදයකින් තොරව මේ මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ කොටසේ වැඩ කටයුතු කරගෙන යන්න පුළුවන් කියලා මම හිතනවා. ඒ වගේම මේ සභාවේ සියලුම කාර්ය මණ්ඩලය ගරු සභාපතිතුමා ඇතුළු අපිට සහයෝගය දැක්වූවා. ඉදිරියේදී මේ සභාවේ සියලු දෙනාටම මේ වගේම සභාවෙ අසුන් අරගෙන අපේ ගමට රටට වැඩක් කරන්න ශක්තිය ධෛර්යය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා බොහොම ස්තූතියි.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා සභාව අමතමින්, 2002 වර්ෂයේ මීගහකිවුල ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්න පටන් ගත්ත දවසේ ඉඳලා අද වෙනකන් නොකඩවා මීගහකිවුල ප්‍රාදේශීය සභාව නියෝජනය කරලා විශාල සේවයක් අපේ ජනතාව වෙනුවෙන් කරල තියෙනවා. ඒ වගේම අද මේ අවසාන දවස මං දන්න විදිහට 2018 සභාවට පත් වෙලා මේ පහුගිය කාලය බලද්දි හිටපු සියලු සභාපතිවරුන්, හිටපු නිලධාරීන්, ලේකම්තුමියලා, මන්ත්‍රී මණ්ඩලය එක සහයෝගයෙන් අපිට මේ මීගහකිවුල පුරවරය ගොඩ නගන්න විශාල කාර්යභාරයක් කරන්න හැකියාව ලැබුණා. ඒක කොට්ඨාසයෙන් එහාට ගිහිල්ලා මුලු මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම නියෝජනය වන පරිදි හැම තැනම වගේ අපි මැදිහත් වෙලා විශාල වැඩ කොටසක් කිරීමේ හැකියාව ලැබුණා. සභාපතිතුමා, අපි එකට මැතිවරණයට ආවා නන්දන මන්ත්‍රීතුමාලා අපි බුලත් කොලෙන් එකට ඉල්ලුවා. ඒ හින්දා එකම හැඳුනුම්කමක් තියෙන දන්න කියන යාළු මිත්‍රයෝ කණ්ඩායමක් මේ සභාව ඇතුලෙන් නියෝජනය කරමින් මීගහකිවුලේ දියුණුවට විශාල වැඩ කොටසක් කරන්න හැකියාව ලැබුණා. විශේෂයෙන්ම අති දුෂ්කර ගම්මානවලට පාරක්වත්, විදුලියවත් තිබ්බෙ නැති ගම්මානවලට පාරවල් ටික දීලා විදුලිය දීලා ඒ මිනිසුන්ගේ ආර්ථිකය ජීවන තත්ත්වය ඒ සියල්ල අධ්‍යාපනය නගා සිටුවීමට අපිට දායකත්වය දෙන්න හැකියාව ලැබෙන්නේ ප්‍රාදේශීය සභාව විදිහට ප්‍රාදේශීය සභා නියෝජිතයෝ විදිහට. ඒ වගේම පහුගිය කාලේ රටේ ඇති වෙච්ච තත්ත්වයත් එක්ක දැන් මොනා කරත් වැඩක් නැහැ. අද කනගාටුවක් තියෙනවා පාර හැදුවෙ ඇයි? අපි ඇයි ලයිට් දුන්නේ, ඇයි රැකියාවක් දුන්නෙ ඇයි? ඒ දුන්න මිනිස්සුම තමයි, ලොකුම ප්‍රයෝජන ගත්ත මිනිස්සු තමයි අද ලොකුවටම විවේචනය කරන්නේ ඒ කියන්නේ නොකර ඉඳලා නෙවෙයි කරලා හොඳට ඒ ප්‍රතිලාභ ටික අර ගැන තාමත් ඒක භුක්ති විදින ගමන් ඒ දේ කරනවා ඔවුන්. හෝක්කුවල උද්ඝෝෂණය කර කර ඉඳපු උපාධිධාරීන් පනස් දහසකට රැකියා දෙන්න දේශපාලන තීන්දුවක් අරගෙන රැකියා ටික දීලා බයික් එක දුන්නම ඒ බයික් එකේම ගිහිල්ලා එතුමාට විරුද්ධව ඡන්ද දාලා ආවා. ඒ වගේ තමයි දැන් පහුගිය කාලේ නන්දන මන්ත්‍රීතුමා වැඩිය ගණන් ගන්න එපා එතුමා දේශපාලනයේ ඉද්දිම රැකියාව ලැබුනේ. උපාධිධාරීන් අපිට මතකයි අපි ඔහේ ගියා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා තීන්දුවක් ගත්තා උපාධිධාරීන්ට රැකියා දෙන්න. අද ඒ රැකියාවල් අරගෙන ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට පින් සිද්ද

වෙන්න ඒකෙන් ජීවත් වෙන ගමන් ගෝයා ගෝ හෝම්, හොරු එළවමු එහෙම තමා කියන්නේ. මම මේක කියන්නේ යම් කිසි උදව්වක් ගත්ත නම් එකේ ගුණයක් නැති මිනිස්සුන්ට අනාගතයක් නැහැ ජීවිතේ කොයි අවස්ථාවක හෝ ඇදගෙන වැටෙනවා වැටෙනවාමයි. මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ ඉන්න සංවර්ධන නිලධාරීන්ගේ ෆේස්බුක් එකවුන්ට් එකට ගියාම අපිට ඒ ගුණමකුකම හොඳට පේනවා. එක්තරා නිලධාරියෙක් ඉන්නවා ගරු සභාපතිතුමා ඔබතුමාගේ කොට්ඨාසයේ යූඑන්පී. හැබැයි බදුල්ලෙ ශෂීගේ දකුණු අත. ශෂී මැදිහත් වෙලා යූ එන් පී ඉදිද්දි රැකියාව දුන්නෙ. අද ලොකුම විවේචකයා එතුමා. ඒ හින්දා ඒ වගේ ගුණමකු පුද්ගලයන්ට පැයක්වත් නෑ කියන්න කැමතියි. මම නිමල් මන්ත්‍රීතුමාටත් ඉස්සෙල්ලා මතක් කරා නිමල් මන්ත්‍රීතුමාගේ සිද්ධිය. මම ඊයෙත් ෆේස්බුක් එකේ දැක්කා. පුළුවන් තරම් රැක්කා මෙතුමා ප්‍රශ්න එන කොට. ඒ හින්දා ඒක තමයි මිනිස්සුන්ගේ ගුණමකුකම , හැබැයි අපිට ආඩම්බරයක් තියෙනවා. චමින්ද මන්ත්‍රීතුමා, මන්ත්‍රීතුමා වෙලා ඉද්දි පාරේ ගමේ මිනිස්සු අරගලයක් කරා. අපි අවුරුදු ගණනාවක් තිස්සේ කරා ලියුමකින් හරි මොකකින් හරි උදව් කෙරුවා. මිනිස්සු ගොඩ නහන්න අවශ්‍ය දේවල් කරා හැබැයි සමහරු කොරෝනා කාලයේ මිනිහෙක් ළඟ නැහැ අපි රුපියල් දහදාහක් හරි එකතු කරලා අපි මොනාහරි ද්‍රව්‍ය දුන්නා. ඒ දහදාහවත් දුන්නේ නැහැ. අද මිනිස්සු ළඟ ගිහිල්ලා ඡන්දෙ ගන්න. තල්දෙන ජනතාව ගැන මට විශ්වාසයක් තියනවා. අපි කරපු දේවල් අපි මිනිස්සුත් එක්ක ජීවත් වෙච්ච ඒ විදිහට කියන කරුණු කාරණා සියල්ල ගොනු උනාම ඊළඟ ප්‍රාදේශය සභාව තල්දෙන නියෝජිතයා විදිහට මං පොහොට්ටුව නියෝජනය කරනවා. ඒ මම මිනිස්සුත් එක්ක ජීවත් වෙච්ච විදිහට මට මගේ මිනිස්සු ගැන තල්දෙන විශ්වාසයක් තියෙනවා. ඒ වගේම කවුරු මොනවා කිව්වත් මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ බහුතර කොට්ඨාස සංඛ්‍යාව අපි මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ පොහොට්ටුව ජයග්‍රහණය කරනවා. මිනිස්සු මේ වෙලාවේ බය අරලා පීඩනයට පත් කරලා අපේ මිනිස්සු එළියට එන්නේ නැති මට්ටමකදී හැබැයි මිනිස්සු ඡන්දේ දෙනවා. ඊලඟ ප්‍රාදේශීය සභාව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් ප්‍රාදේශීය සභාවක් විදිහට බිහි වෙන අතර මේ ඉන්න කණ්ඩායම තම තමන්ගේ පක්ෂ නියෝජනය කිරීමේ හැකි අයුරින් අපි සියලු දෙනාටම මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්න ශක්තිය ධෛර්යය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මෙතුවක් කල් මේ රාජකාරි කටයුතු කරගෙන යන්න උදව් කරපු ගරු සභාපතිතුමා, මත ගැටුම් මත වාද මොනවා නිර්මාණය වුණත් අපි අවශ්‍ය තැනදී පොදු අරමුණ වෙනුවෙන් එකට හිට ගත්තා, එතුමාටත් ස්තුතිවන්ත වෙමින් සහයෝගය දැක්වූ සියලු නිලධාරීන්ට සියලුම දෙනාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමින් ලේකම්තුමිය ගෙන ඉල්ලීමක් තියෙනවා කරන්න. අපි දැන් ගැසට් එක ගැහුවට පස්සේ හෙට යයි එතකොට ඔබතුමියට දේශපාලන බලපෑම් මොකුත් නැහැ රකින්න සේවක කළමනාකරණ කරන්න හරියට මේකේ ගොඩ දෙනෙක් බලාගෙන ඉන්නේ අපි කවද්ද එළියට යන්න කියලා. කොයි වෙලාවෙද ගැසට් එක ගහන්නේ, කොයි වෙලාවටද එළියට යන්නේ ඇයි තමන්ට ඕන විදිහට ඉන්න. ඒ හින්දා ඔබතුමිය තරුණ නිලධාරිනියක් විදිහට කවුරුත් කියන්නෑ සභාපතිතුමා කතා කරලා කියන්නෙත් නැහැ ඕක කරන්න එපා කියලා අපි කියන්නෙත් නැහැ ඔබතුමිය ප්‍රාදේශීය සභාවේ සේවකයෝ ටික කළමනාකරණය කරලා හොඳින් මේ මාස දෙක තුන කරගෙන යන්න ඉල්ලා සිටිමින් නැවත වාරයක් අපිට උදව් උපකාර කරපු සියලු දෙනාටම බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මාර්තු අට නවය වෙනකොට නැවතත් මේ මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ නියෝජනය කිරීම සඳහා ඔබ සියලු දෙනාටම ඒ ශක්තිය ධෛර්යය ඔබතුමා මට ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් තල්දෙන කොට්ඨාසය මගේ ජනතාවගේ විශ්වාසය මම නැවතත් මෙම ස්ථානයේම අසුන් ගන්නා බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බෙහෙවින්ම ස්තුතියි .

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දිසානායක මැතිතුමා**

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දිසානායක මැතිතුමා සභාව අමතමින්, 2018 ප්‍රාදේශීය සභාවේ අවුරුදු 5 කට අධික කාලයක් මාත් එක්ක ගරු සභාපතිතුමාගේ සැබෑ නායකත්වයෙන් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මේ මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ගොඩනගමු කියන ආකල්පය මත ඇත්තටම අපේ මන්ත්‍රීවරු සියලු දෙනාම එකතු වෙලා වැඩ කරා. ඒත් අපේ රටෙට විටින් විට ආපු ව්‍යවසනයන් හින්දා අපේ ඉලක්ක කරා අපිට ළඟා වෙන්න අවස්ථාවක් උදා වුණේ නැහැ. ඒත් මං හිතන්නේ අපිට හැකි උපරිමයෙන් මේ මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජනතාවට යම් කිසි සේවාවක් ඉටු කරන්න පුළුවන් වුණා කියලා මම විශ්වාස කරනවා. ඒ අපේ ගරු සභාපතිතුමාගේ නායකත්වයෙන් මේ මන්ත්‍රී මණ්ඩලය සහයෝගයෙන්. ඒ නිසා අද සමහරවිට අපිට මේ පාර සභාවෙන් අපිට මන්ත්‍රී ධූරයෙන් ඉවත් වෙලා යන්න ගියත් නැවතත් කුමන හෝ පක්ෂයක් නියෝජනය කරමින් අපි පළාත් පාලන ඡන්දේ දිනලා එන්න පුලුවන් උනත් බැරි උනත් මේ මුළු ප්‍රාදේශීය සභාව ඉදිරියේදිත් සහයෝගයෙන් එකමුතුව කටයුතු කරගෙන ගිහිල්ලා ඉදිරියේදී හරි මීට වඩා අපි බලාපොරොත්තු වුණු ඉලක්කවලට යන්න පුලුවන් ශක්තියක් ඒ නවක මන්ත්‍රීවරුන්ට උදා වෙයි කියලා මම විශ්වාස කරනවා. ඒත් එක්කම අපි මේ තාක්කල් ආපු ගමන ගැන මං හිතන්නේ මේ ඉන්න සියලු මන්ත්‍රීවරු අද ගොඩක් සතුටු වෙනවා. ඒක ඔබතුමාගේ දක්ෂතාවයත් එක්ක සියලුම මන්ත්‍රීවරුතුමන්ලා ළඟ රඳවා ගෙන තමන්ගේ ගෞරවය රැකෙන පරිදි ජනතාව ඉස්සරහට ගිහිල්ලා කතා කරන්න පුළුවන් හැකියාවක් අද සමාජයේ තුළ අපිට ගොඩනැගිල්ල තියනවා. එක විවිධ මතිමතාන්තර එක්ක සමහරක් විට ඒක පුළුවන් ඒත් අපි මීගහකිවුල ප්‍රාදේශීය සභාවක් විදිහට රටටම ආදර්ශයක් දුන්නා. අපි සහයෝගයෙන් යුතුව ගිය ප්‍රාදේශීය සභාවක් විදිහට ඒක මං හිතන්නෙ අපේ සභා ලේකම්තුමිය, හිටපු සභා ලේකම්තුමිය, ඒ සියලු කාර්ය මණ්ඩලය ඒ සියලුම නිලධාරී මහත්ම මහත්මීන් අපිට සහයෝගය ලබලා දුන්නා. ඇත්තටම ඒ කට්ටියට අපගේ හද පිරි ස්තුතිය පුද කරනවා මේ අවස්ථාවේ දී. කුමන හෝ ඉදිරියේදී අපිට සමහරවිට කියන්න බැහැ තීන්දුවක් එයි 8 වෙනිදා නව වැනි දා වෙනකොට පළාත් පාලන මැතිවරණය තියෙයි ද නැද්ද කියලා ඒ තිබුණා හෝ නැති වුණා හෝ එන සියළුම මන්ත්‍රීවරුන් සභාව ඉදිරියේදී තිබිලා කොයි වෙලාවක හරි මේ සභාවට එන මන්ත්‍රීවරුන්ට හොඳ ගමනක් යන්න පුළුවන් වෙයි කියලා විශ්වාස කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මීළඟට මූලාසන සභාව අමතා, මූලාසනය පිළිතුරු කතාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

මූලාසනය සභාව අමතමින්, මං හිතන්නේ අද දවස ඉතාමත් තීරණාත්මක දවසක්. සන්තෝස දායක දවසක්. ඒ වගේම අතහැරිය යුතු දවසක් හෝ භාරගත යුතු දවසක්. මං හිතන්නේ අද අපි ආරම්භයම අපි විශේෂ තේ පැන් සංග්‍රහයකින් තමයි අද සභාව ආරම්භ කළේ. ඉතින් මං හිතන්නේ ඔහොම පටන් ගෙන මොනව ලියන්නද මොනවා කියන්නද කියලා මට නම් නෑ තේරෙන්නේ. වසර පහක දේශපාලන අත්දැකීමක් මේ මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් අපේ කණ්ඩායම විශේෂයෙන්ම නන්දන මන්ත්‍රීතුමා මතක් කරා වගේ සුන්දර පුරවරයක් සුන්දර ප්‍රදේශයක් නිර්මාණය කරන්නත් මහා විශාල පරිශ්‍රමයක් දැරූ කණ්ඩායමක් එක්ක දේශපාලනය කරන්න ලැබීම මා අතිශය සතුටට පත් වෙනවා. මගේ දේශපාලන දිවිය විතරක් නෙවෙයි මං හිතන්නේ මගේ ජීවිත කාලය මං කරපු රැකියාවන් මං කරපු දේශපාලන ක්‍රියාදාමයන් මං කරපු වෙනත් කාරණා වලදී මම දැක්ක සුන්දරම වසර පහ කියලා මම අද ඔබතුමාලට ප්‍රකාශ කරනවා. මොකද හේතුව අපේ මන්ත්‍රීතුමන්ලා ඔක්කොම කිව්වා වගේ අපි අලුත් කන්සෙප්ට් එකක් ලංකාවටම ඉදිරිපත් කරා. අපි කණ්ඩායමක් වශයෙන් වැඩ කරනවා කියන ඒක ලංකාවට පෙන්නුවා. හැබැයි කවුරුත් ඒක එච්චර දකින්න කැමති නැහැ එහෙම concept එකක් තියෙන කොට දේශපාලන පක්ෂ අතර ලොකු ප්‍රශ්නයක් තියනවා. කණ්ඩායමක් එකතු වෙලා වැඩ කරන කොට ඒ කණ්ඩායම එකයි කියන අලුත්

සංසිද්ධියට සියලු දේශපාලන වලින් මං හිතන්නේ වැඩි කැමැත්තක් තියෙන්නෙ නැහැ දැන් අකමැත්තක් තියෙනවා. මොකද භේදභින්න කරලා දේශපාලනය වෙන්කරලා දාලා ප්‍රාදේශීය සභාව විනාශ කරන්න පුළුවන් යුගයක් නිර්මාණය කරන්න බැරි වුණා. ඒ නිසා මම ඔබතුමාලාට නැවත වතාවක් ගෞරවනීය ස්තුතිය පුද කරනවා. සතුටු වෙනවා ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයා, විපක්ෂයේ අපේ කපිල මන්ත්‍රීතුමාට, අපේ සමන්ත උපසභාපතිතුමාට, ඔබ සියලු මන්ත්‍රීතුමන්ලාට මගේ මන්ත්‍රීවරුන් සියලු දෙනාට මේ ශක්තිය ධෛර්යය මට ලබලා දුන්නා. මේ සුන්දර පුරවරයක් නිර්මාණය කරන්න හැබැයි මේ සුන්දර පුරවර නිර්මාණය කිරීමේ දී යම් යම් ගැටලු මතු වුණා. ඒකත් පැහැදිලිව කියන්න ඕන ඔබතුමාලා දන්නවා මේ වසර පහ අපිට මං හිතන්නේ ලංකා දේශපාලන ඉතිහාසයේ කළු පැල්ලම් කිහිපයක්ම එකතු කරපු වසර පහක්. එක්තරා කාලයක අපේ පක්ෂය වෙන පැත්තක ආණ්ඩුව වෙන පැත්තක තිබුනා, ඊට පස්සේ කොරෝනා ආවා, ඊට පස්සේ සහරාන් ගැහුවා, ඊට පස්සෙ තවත් විවිධ මති මතාන්තර ආවා, අන්තිමට අරගලය ආවා. මේ සියලු කාරණා නිසා අපේ වැඩ විශාල වශයෙන් පස්සට ගියා. ඒ වගේම අපි අද ඉන්නේ ලෝකයේ දරාගන්නම බැරි ආර්ථික අර්බුදයක. එහෙව් කාලයක අපි ලංකාවේ දුප්පත්ම ප්‍රාදේශීය සභාවලින් එකක් වශයෙන් අපි මේ තත්වයට මුහුණ දුන්නා. අපේ වෙක් පතක්වත් අගරු බවට පත් නොවී අපේ දේශපාලනය පරිපාලනය මේ දෙකම යාකරණ මේ යාන්ත්‍රණය තුළ ඉතා අති දක්ෂ විදිහට මේ මීගහකිවුල ප්‍රාදේශීය සභාව හැඩල් කරා කියන එක අපිට බය නැතුව සමාජයට ප්‍රකාශ කරන්න පුළුවන්. ඔබතුමන්ලා මංජුල මන්ත්‍රීතුමා, නිමල් මන්ත්‍රීතුමා කිව්වා වගේ අපි ජනතාවට වැඩ කරා. උප සභාපතිතුමා ජනතාවට වැඩ කරා. නිමල් මන්ත්‍රීතුමා ජනතාවට වැඩ කරා. දිසානායක මන්ත්‍රීතුමා වැඩ කරා. මංජුල මන්ත්‍රීතුමා වැඩ කරා. අපේ මන්ත්‍රීතුමිය වැඩ කරා, ශ්‍රියානි මන්ත්‍රීතුමිය වැඩ කරා, නන්දන මන්ත්‍රීතුමා වැඩ කරා, විපක්ෂ නායකතුමා වැඩ කරා, පුළුවන් ආකාරයට වැඩ කරා වැඩ නොකර හිටියේ නෑ. තමන් විසින් ඔගොල්ලන් දන්නවාද ප්‍රාදේශීය සභාවට යම් මුදලක් ආවා නම්, ප්‍රතිපාදනයක් ආවා නම්, වීදි ලාම්පුවක් ආවා නම්, කුණු බඳුනක් ආවා නම්, මේ සියලු දේවල් පක්ෂ පාට භේදයකින් තොරව ඔබ සියලු දෙනා අතර මම පැහැදිලිසේ බෙදා හැරියා ඔයගොල්ලෝ එක දන්නවා. මුදලක් අපිට ආවේ නෑ විශාල ව්‍යාපෘති හරියට ආවේ නෑ ඒ ආපු ව්‍යාපෘතිය ආවා නම් මං ඒකෙත් ඔබතුමාලට ප්‍රාදේශීය සභාව තුළින් මට ලැබී ඇති බලය තියෙන ප්‍රධාන වශයෙන් ඒ තුළ වැඩ කරන්න ඒ තුල ඔබ පක්ෂ පාට භේදයකින් තොරව ඔබට මම සියලු දේවල් බෙදලා තියෙනවා. ඔබ දන්නවා මේ සියලු කාරණාවලදී මේ සියලු දේ ඔබ දන්නවා. මම අම්හිරි අත්දැකීමකට මුහුණ දුන්නා අරගලයේ දී ඔබ දන්නවා මරණාසන්න මරණය දැකලා මරණය කියන එකට මුහුණ දීලා මම නැවත ඉපදුන පුද්ගලයෙක් වශයෙන් තමයි මම අද ඔබතුමාලත් එක්ක කතා කරන්නේ. ඔබතුමන්ලා ඉදිරියේ ඒ හා සමාන වූ මට අසාධාරණ ලෙස මං හිතන්නේ ඒ පහර දීමට ලක් වෙලා හිටපු යුගයක මට දේශපාලනය අත වැනුවේ නැහැ බය නැතුව ප්‍රකාශ කරනවා. මගේ වෙන යාලුවෝ  අත ඇරියේ නැහැ දේශපාලනයෙන් ලොකු දෙයක් මට සිද්ධ වුණේ නැහැ ඒ වෙලාවේ හැබැයි මගේ මන්ත්‍රීතුමන්ලා පක්ෂ පාට භේදයකින් තොරව මම ස්තුතිවන්ත වෙනවා උප සභාපතිතුමා මේ සියලු මන්ත්‍රීතුමාට ගෞරවනීය ස්තුතිය පුද කරනවා ඔබ තමුන්නාන්සේලා තමයි මාව රැකකේ. ඔබතමුන්නාසේලා දේශපාලන ශක්තියක් ලබලා දුන්නේ. අපේ ජේවීපී සහෝදරයා අපි දේශපාලනය වශයෙන් මොන මතිමතාන්තර වල හිටියත් විපක්ෂ නායකතුමා උප සභාපතිතුමා මගෙ මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනා එතකොට ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයා පවා මා වෙනුවෙන් හැමවෙලාවෙම මගේ හිත හදන්න මා වෙනුවෙන් මාව ශක්තිමත් කරන්න ඒ සභාවක් වශයෙන් අපි එකට හිටපු ඒ කන්සෙප්ට් එකේ තිබුණ විශේෂ වැදගත්කම තමයි. ඔවුන් මාව රැක්ක අපි ලොකු මිනිස්සු වෙනුවෙන් ආවේ. ලොකු මිනිස්සුන්ට මතක් කරලා දෙන්න ඕනා රැස්වීම වලට ගිහිල්ලා කනගාටුවෙන් වුණත් මම කියනවා අපේ සමහර දේවල් මීට වැඩිය දෙයක් කරන්න තිබුනා ලොකු මිනිස්සු මේ දේවල් වලට උදව් කරේ නැහැ පැහැදිලිවම. අපි දේශපාලනය කරාට අපි නාමත් පොහොට්ටුවෙන් ඡන්දෙ ඉල්ලන්නෙ අපි පොහොට්ටුව දාලා ගියේ නැහැ අපි අසාධාරණ නැහැ අපිට අසාධාරණ අනන්තවත් වුනා. මේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල අපේ මන්ත්‍රීවරුන්ට කොච්චර අසාධාරණ කම් වුණාද තමන්ගේ ගමට යන පාර හදන්න ගියාම ඒකට ප්‍රතිපාදන වෙන් උනාම කොරෝනා වලින් ආධාර මුදල් වෙන් වුණාම මේ සියලු කාරණා වලදී අන්තිමට අපිට උනා නිලධාරීන්ගේ පිටිපස්සේ ගිහිල්ලා හිට ගන්න. එහෙම ශක්තියක්වත් අපිට ලබලා දුන්නේ නැහැ. මම අදටත් දේශපාලනය වශයෙන් ඉතාම කණගාටුවෙන කාරණාවක්. මේක අපේ මන්ත්‍රීතුමන්ලට අපේ මන්ත්‍රීතුමන්ලාගේ ඉඩම් කැල්ලකට යම් ප්‍රශ්නයක් තිබ්බනම් ඒ ඉඩම් කැලි ප්‍රශ්න වලින් අඩුම ගානෙ ඉදිරිපත් වෙලා ඒකවත් විසඳලා දෙන්න පුළුවන් එකෙක්වත් මේ ඌව පළාතේ හිටියේ නැහැ මන්ත්‍රීවරයෙක් හෝ මොන දේශපාලන පක්ෂයක්වත් අපිට සහයෝගය දෙන්න. ඔබ තමුන්නාන්සේලා මේ කතාව වැරදි වෙන්න පුළුවන්. නමුත් ඇත්ත කතාව තිත්ත වෙන්න පුළුවන් ඇත්ත කියන එක මගේ මේ දේශපාලනයෙන් අපි හෙට ගියත් අද ගියත් නැවත පත්වෙලා ආවත් අපි ජනතා හිතවාදී ප්‍රාදේශීය සභාවක් පවත්වා ගෙන ගියා. අපි දන්න ඔබ තමුන්නාන්සේලා විශේෂයෙන් මතක් කරන්න ඕන ඔබ තමුන්නාන්සේලාගේ සහයෝගයෙන් අපි මේ ආර්ථික අපහසුතා මේ කියන දුෂ්කරතා මැද අපි විශාල සංවර්ධන ක්‍රියාදාමයක් නිර්මාණය කරා. මට දුකයි පුංචිලෝකාන්තය අවුරුදු පහක් ඉල්ලීම් කරා වසර හතර හමාරක් අපි ආපු දවසෙ ඉඳන් අපේ ප්‍රදේශයට සංවර්ධනය ගේන්න. හැබැයි මම ගෞරවයෙන් සිහිපත් කරනවා ගරු ආණ්ඩුකාරතුමා, පළාත් පාලන කොමසාරිස්තුමා, එතුමන්ලා දෙපළ බොහෝම එකතු වෙලා අපිට ඒ මුදල් ටික පවා වෙන් කරල දුන්නා. හැම ශක්තියක්ම අපිට ලබලා දුන්නා. හැබැයි අපි මේවා දැම්මා ප්‍රාදේශීය සංවර්ධන කමිටු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු මේ හැම එකෙන්වත් රජයකින්වත් LRC එක පිටු පස්සෙන් ගියා. ඒ මිනිස්සු ගෙනාවා. ඔබ තමුන්නාන්සේලාට කිව්වට මේ අවසාන සභාව විය යුතු නිසා කියන්නේ සමහර විට මගේ අතේ මුදල් මගේ ගෙවල් වල තිබෙන මුදල් ආර්ථික වශයෙන් මම ශක්තිමත් වෙලා මම මේ ප්‍රාදේශීය සභාවට ආවේ. ඒ සියලු දේවල් වලට මොනා වුනාද කියලා අපේ මන්ත්‍රීවරු කිව්වා, මන්ත්‍රීවරු දැක්කා ඔබ තමුන්නාන්සේලාගේ විපක්ෂය පවා දන්නවා, ජනතා විමුක්ති සහෝදරයා පවා දන්නවා ඒවා වියදම් කර ගෙන සභාවේ සභා ලේකම්තුමිය දන්නවා සමහර බිල් දානවා. මම දෙනවා කරන්න දෙයක් නැහැ සමහර දේවල් අපි දන්නවා සභාවේ සල්ලි නැහැ. මේක ඉතාම දුප්පත් ප්‍රාදේශීය සභාවක් හැබැයි ඒකවත් අපිට කර ගන්න පුළුවන් හැකියාවක් තිබුණේ නැහැ. නමුත් අපි යන්න කලින් සතුටට කාරණයක් උපසභාපතිතුමා මම දැන් ඉස්සෙල්ලා ප්‍රකාශ කරා අපි පුංචිලෝකාන්තේ වෙනත් මාර්ගයකින් ආණ්ඩුකාරතුමාටයි, කොමසාරිස්තුමාටයි පින්සිද්ද වෙන්න මීගහකිවුලේ අපි නමක් තියලා යනවා. ඒක හින්දා ලේකම්තුමිය ඔබතුමියට කියනවා එකේ වැඩ පටන් ගත්තොත් මේ මගේ නමත් ඇතුළුව මේ කණ්ඩායමේ නම් සහිත පුවරුවක් හයි කරන්න මේ වෙනුවෙන් අපි ප්‍රාදේශීය සභාවේ වැඩි කාලයක්, වැඩි වේලාවක් වැඩි ශක්තියක් වැඩි මුදලක් වැය කරේ. පුංචි ලෝකාන්තයේ නිර්මාණය කරන්න ඒක අද වෙනකොට හැරි ජයවර්ධන මැතිතුමා අපිට සියයට තිහක කොමිස් මුදලක් යටතේ ලබා දීමට එකඟතාවය ලිපිය මට ලබලා දුන්නා. මං හිතන්නේ අද ඒකත් අපි ඊයෙ ලබා ගත්තා අපි අද ගියත් හෙට ගියත් ඒ නිර්මාණය සතුට අපිට තියනවා. කවද හරි මේ මීගහකිවුල ප්‍රාදේශීය සභාව ගොඩනැගෙනවා. ඒ ගොඩනැගෙන්නේ පුංචි ලෝකාන්තයෙන් අපි ඉදිරියේදී පවත්වන කොයිකා ප්‍රොජෙක්ට් එකක් නිසා මේ මීගහකිවුල ප්‍රාදේශීය සභාව ලංකාවෙ තියෙන එක්තරා හොඳ ප්‍රාදේශීය සභාවක් ආර්ථික වශයෙන් ශක්තිමත් ප්‍රාදේශීය සභාවක් කියන්න අපි ශක්තිය දැම්මා. හැබැයි මේ ජනතාව ඒක දන්නෙ නැහැ. ජනතාව මේක කියන්නෙත් නැතුව ඇති අපේ කොල්ලොන්ගෙ ශක්තියම, සභාපතිතුමාගේ නිර්මාණශීලී තත්ත්වය. හැබැයි මේ දේවල් අපි ඔක්කොම අපි ඒ වගේම ඔබතුමාලා දන්නවා මේ මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ හැමදාම ප්‍රශ්නය වතුර. අපි මේ වතුර ප්‍රශ්නයට වතුර බට ගෙනවා මීටර් 4900 ඒ සියලු දේවල් අපි වැඩ පටන් ගන්න අපි ආරම්භ කරා මුල් ගල තිව්වා. නිමල් මන්ත්‍රීතුමාට මතක ඇති හැබැයි මේ සියලු කාරණාවල අපිට අවසන් කර ගන්න බැරි වුණා. මේ ලෝක ආර්ථික අර්බුදයත් එක්ක ඒ නිසා තමයි අපිට මේක අවසන් කර ගන්නට ඇත්තටම හැකියාවක් නොලැබුනා. හැබැයි ඒ මුදල් අපි දන්නවා අතිගරු ජනාධිපතිතුමා එතුමා අති දක්ෂ පරිපාලකයෙක් එතුමා මේ මුදල් ලබා ගත්ත දිනෙක මං හිතන්නේ මැතකදී වෙනත් නමකින් හෝ මේක පවත්වා ගෙන යයි මේ ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වෙයි. ඒ මීගහකිවුල ඒ නිසා ඒකත් අපි ආරම්භ කරපු දෙයක්

අපිට තිබුණු කළු පැල්ලම් පහ නිසා තමයි අපිට වැඩක් කරගන්න බැරි වුණේ. ඉතිං ඒ නිසා ඒක අපේ අඳුරු යුගයක්. ඒ යුගයේ තමයි අපි සභාව, සභාපතිකම කරේ ඔබතුමන්ලා ලේකම් කරේ. හැබැයි අපිට පුළුවන් විදිහට අපි කරා. අපි දන්නවා අපි දැම්මා මට ලැබුණු වීදි ලාම්පු ටික මේ සියලුම දෙනාට සමසේ බෙදලා දුන්නා. වීදි ලාම්පු ටික අද අපේ හැම ගමකම වගේ තියෙනවා. තවත් අඩුපාඩු වීදි ලාම්පු දෙක අපේ ලේකම්තුමියගෙන් අපිට ලබාගන්න පුළුවන්. ඒ වගේම අපි ඒ පැත්තත් අපි කරා. ඉතින් මං හිතන්නේ මේ සුන්දර මීගහකිවුලේ හදන්න ඇති මාර්ග තිස් හයක් මං හිතන්නේ අපි මෙගා ව්‍යාපෘතියක් කිලෝමීටරයෙන් එහා project. මන්ත්‍රීතුමනි ඔබතමුන්නාන්සේලා දන්නවා කැටවත්ත, මීගහකිවුල, කරදගහමඩ, කෝමාරික, තල්දෙන ව්‍යාපෘතිය ආරම්භ කරා. සමහර ව්‍යාපෘති අවසන් කරන්න බැරි වුණා, ඒකත් අපිට පහරක් තමයි, නමුත් ඒක ලෝක ප්‍රශ්නයක් ඒක ජනතාව දන්නවා, අපිට ඒ හැකියාව ලැබුණා. ඒ හැකියාව ලැබිලා අපි ඒ ටිකත් අපි ලස්සනට ඇත්තටම කරලා තිබුණා, ඒ නිසා අපිට ගමට බහින්න ලොකු අපහසු තාවයක් නැහැ සියලු දෙනාටම යන්න පුළුවන් ජනතාව අතරට. ප්‍රශ්නය ඒක අපි නෙවෙයි හැදුවේ ඒක හදන්න මේ මාධ්‍ය මඟින් මම කියන්නේ මාධ්‍යයෙන් හදපු ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්න ජනතාවට තියෙනවා. අපිට පක්ෂ වැඩක් නෑ .ආණ්ඩුව වැඩකුත් නැහැ අපිට තියෙන්නෙ අපි වැඩ කරා. අපි ගමේ හැම මළ ගෙදරකටම අපි ගියා. අපිට යන්න පුළුවන් හැම මඟුල් ගෙදරකටම අපි ගියා. කරන්න පුළුවන් සහයෝගය අපි දුන්නා. වතුර නැති වෙලාවට මම කොහොම හරි මොන ක්‍රමයෙන් හරි අපේ අතේ සල්ලි වලින් දාලා හරි වතුර බවුසරයේ මම ගෙවල් වලට මම යැව්වා. අපි ජනතා හිතවාදියෝ කරලා තියෙනවා. අපේ පවුල් වලට කිසි දෙයක් කර ගෙන නැහැ. අපේ පවුලට කියලා කිසිම දෙයක් කර ගත්ත දෙයක් නැහැ. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් මේ සියලු කරුණු කාරණා සිදු කරේ. ඒ වගේම මේ මීගහකිවුල ජනතාවගේ අනවශ්‍ය ඉදි කිරීමක් මම සතුටු වෙනවා මේ මීගහකිවුල මිනිස්සු කොන්ද පණ නැති එකා කියලත් මට බැන්නා. ව්‍යාපාර ස්ථාන මම අයින් කරේ නැහැ කියලා. මම අයින් කරේ නැත්තෙ අපි මිනිහෙකුගේ ව්‍යාපාරයක් අයින් කරනවා නම් මේ රටේ ඒ මනුස්සයාට ඒ සුදුසුකම් ලබා දිය යුතුයි. ඒ කියන්නේ ඔහුට කොහේ හරි ව්‍යාපාරයක් කරන්න ලබා දිය යුතුය ඒ සංකල්පය මගේ ළඟ තිබ්බා. හැබැයි මිනිස්සු බැන්නත් අද ටවුන් එකට බහින කොට අද කියනවා සභාපතිතුමා ඔබතුමා අපිට කරපු සේවාව ඉතා අගනා සේවාවක්. අපිට කරේ ඔබතුමා අපි ඉවත් කරේ නැහැ. මම කිසිම කෙනෙක්ගෙ කඩේ අඩුමගානේ ඉටිරෙදි කැල්ලක්වත් ගැලෙව්වෙ නැහැ. මම එහෙම කරන්න නැතුව හරියට මේ කටයුත්ත සිද්ධ කළේ මේ ජනතාව ගැන හිතලා. ජනතාව ජීවත් විය යුතුයි කියන කාරණාව අපේ එකම වගකීම පරමාර්ථය මේ රටේ ඉන්න අහිංසක ජනතාව අපේ ප්‍රදේශයේ ඉන්න ජනතාව සුඛිත මුදිත පත් කිරීම කියන ඒ සංකල්පය තුළ නිසා නැත්තම් මම තරම් ඔය කියන කවුරුත් කවුරු මොනා කිව්වත් මම ඇත්තටම පලාත් පාලන නීතිය පිළිබඳව මට හොඳ හසල දැනුමක් තියනවා. ඒ වගේම මට ගොඩක් පළාත් පාලන දෙපාර්තමේන්තුව සියලු නිළතලයන් ආණ්ඩුකාරතුමා ප්‍රමුඛ සියලුම කණ්ඩායමක් මීගහකිවුල සභාපතිතුමාට විශේෂ අවධානයක් යොමු කරනවා, විශේෂ තැනක් දෙනවා. මොකද අපි බොහොම සුහදශීලීව ඇසුරු කරපු නිසා ඒ නිසා මට ඒක කරන්න බැරි කමක් තිබුණේ නැහැ මම කරේ නැති මෙන්න මේ කාරණා නිසා හෙට අනිද්දට ඒගොල්ලො තේරෙයි ඔය ඉන්න එන්පීපී අනං මනං පක්ෂවලින් සමහර විට ඕක කර ගනී. ඒක නිසා අපිට කරන්න පුළුවන් හැකියාවක් නැහැ. නවත්තන්න බැරි වෙයි ඒ වගේ දේවලුත්. ඒ නිසා මොකක්ද සිද්ධ වෙන්නේ කියලා මෙහෙම අපි සුන්දර පුරවරයක් හදනකොට මේ සියලු කාරණා ඉෂ්ට සිද්ධ කරලා දීලා තියෙනවා. ඔබතුමන්ලා අපිට කියන්න දෙයක් හිතන්න දෙයක් ඉතුරු කරලා ජනතාවගෙන් තියනවා. ජනතාවට අපි කාලෙක ද ගියත් අපි හිටියත් මම ප්‍රාර්ථනා කරන්නේ අපේ සියලු කණ්ඩායමට මීගහකිවුල ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්න ධෛර්යය වාසනාව ලැබෙන්න කියලා මං හිතනවා. අපේ කණ්ඩායමට හැකියාවක් තියෙනවා. මම දැක්කා පාරට බැස්සම ඒ ඒ කියන කණ්ඩායම් දේශපාලන වශයෙන් මෝඩ තීන්දු ගන්න හොඳ නෑ අපි. මොකද අපේ ජනතා විමුක්ති පෙරමුණේ සමහර කට්ටිය තීන්දු අරන් තියෙන්නේ මේවා දෙනවා මේවා දෙනවා කියලා. අපි දන්නවා ජාත්‍යන්තරයේ ප්‍රශ්නයක් තියෙද්දි ජාත්‍යන්තරයෙන් කර කියා ගන්න බැරි වෙනකොට මෙච්චර දක්ෂ රනිල් වික්‍රමසිංහ මැතිතුමා මෙච්චර අමාරු අවස්ථාවකදී රට බාර අරගෙන වැඩ කරන කොට මේ ටික ඔක්කොම කරලා මෙච්චර විශාල මෙහෙයක් කරල රටේ දැන් ඩීසල් ප්‍රශ්න ගෑස් ප්‍රශ්න ඇත්තටම අපි පෝලිමේ නැතුව අපි ජීවත් වෙන කොට ඉතින් මේ වගේ ගැටළු කාරණා ගොඩක් නිර්මාණය වෙන කොට එදා දීපු අනුර කුමාර දිසානායක මැතිතුමා ගත්තෙත් නෑ, සජිත් මහත්තයා ගත්තෙත් නැහැ එතුමා තමයි අරගෙන යන්තම් පොහොට්ටුවත් එකතු වෙලයි යම් ප්‍රමාණයක් වැඩ කටයුතු කරා. මම නම් කියන්නේ එතුමාට තව වසර දෙකක් මේක කරලා මැතිවරණයට යන්න අවස්ථාව වසරක් හෝ තිබ්බා නම් මීට වැඩිය හොඳ ගමනක් යන්න හැකියාව ලැබෙනවා. ඉතින් අපි කිව්වා වගේ ජනතා විමුක්ති පෙරමුණෙන් එක එක දේවල් කියාගෙන එනවා ප්‍රශ්න ඇති කර ගන්නවා තවදුරටත් අපට ශක්තිය ධෛර්යය ලබලා දුන්නා. සමහරවිට අපි කිව්වා වගේ උප සභාපතිතුමා අපිට නැවත මේ සභාවේ අසුන් ගන්න බැරි වේවි මේ දේශපාලන කාලය තුළ සමහර විට පුළුවන් වේවිද කියන්න දන්නේ නැහැ ඉතින් අපිට ඒ අවස්ථාව තුළ මට ශක්තිය ලබලා දුන්නා උප සභාපතිතුමා ප්‍රමුඛ විපක්ෂ නායකතුමා, ලතා මන්ත්‍රීතුමිය, නිමල් මන්ත්‍රීතුමා, ශ්‍රියානි මන්ත්‍රීතුමිය, චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා, එතකොට නන්දන මැතිතුමා, චමින්ද මැතිතුමා, මංජුල මන්ත්‍රීතුමා, අපේ පත්මා මන්ත්‍රීතුමිය එතකොට නිශාදි මන්ත්‍රීතුමිය, බාල මන්ත්‍රීතුමා, රත්නතිස්ස මැතිතුමා ඒ වගේම උඩලකුඹුර මැතිතුමා මේ සියලු දෙනා ශක්තියක් ලබලා දුන්නා. ඒ ශක්තියට මගේ ගෞරවනීය ස්තුතිය ඒ වගේම තෙරුවන් සරණ මේ සියල්ල ඔබට ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම මීගහකිවුල ප්‍රාදේශීය සභාව ගත්ත වෙලාව ඉන්නන් මේ දේශපාලනය පරිපාලනය දෙක හොඳට හඳුනගෙන මට යන්න පුළුවන් වුණා. මම තවත් සතුටට කාරණාවක් තියෙනවා. මම කිසිම සේවකයෙක් ගෙදර යැව්වෙ නැහැ. මොනා කරත් මම කිසිම මේ කරපු දේවල් වල හැටියට සියයට 5 හැබැයි මම කිසිම සේවකයෙක් ගෙදර යැවුවේ නැහැ. ඒ සියලු දෙනාමත් මම මේකේ ආරක්ෂා කරා. හැමදෙනාටම බැනලා හරි මොනවා හරි කරලා අපිට විරුද්ධවත් සමහර කණ්ඩායම් වැඩ කරනවා. ඒක ප්‍රශ්නයක් නැහැ ඒ කණ්ඩායම් ආරක්ෂා කරා මට මුලින්ම එනකොට ගුණරත්න මහත්තයා ශක්තියක් වුණා යම් ප්‍රමාණයකට එතුමා අසනීප වෙලා හෝ එතුමා කලින් ගියා. එතකොට තවත් අපේ හිටියා ලේකම්වරයෙක් එතුමත් අපිට ශක්තියක් වුණා. එතුමා අපිට ආර්ථික වශයෙන් අපිට මුදල කෝටියක් දක්වා ඉතිරි කරලා දෙන්න එතුමාට ශක්තිමත් උනා. ඊට පස්සේ අපිට ආවා අපේ කුසුම් ලේකම්වරිය, එතුමිය විශාල වැඩ කොටසක් අපිත් එක්ක එකතු වෙලා කරා සහෝදරියක් වගේ. ඊට පස්සේ අපිට දියණියක්, අපිට සහෝදරියක්, අපිට මවක් වගේ ඉන්න ලේකම්වරියක්. ඉතින් බොහොම ආසයි වැඩ කරන්න නමුත් අපිට වැඩ කරන්න තිබුණු කාලය ගොඩාක් කුඩයි. ඉතින් ඒ කාලය කුඩා වුණත් එතුමිය අපිත් එක්ක ශක්තිමත්ව අද මේ ප්‍රාදේශීය සභාව අද පවත්වන්න එතුමියගේ හැකියාව එතුමියගෙ දක්ෂතාවයත් ඇයගේ ආදරය අපිට ලැබුන නිසා තමයි අද මේ ප්‍රාදේශීය සභාව මේ ස්ථානයේ දී අද පවත්වන්නෙ. ඉතින් මං හිතන්නේ මේවා මේ ගුණගරුක අයට ගුණගරුත්වය ලබා දෙන්නම ඕන. ඉතින් මං මේ අවස්ථාව අවස්ථාවක් කරගන්නවා මට ශක්තියක් වුණු ඌව පළාත් සභාව, ඌව පළාත් පාලන දෙපාර්තමේන්තුව, කොමසාරිස්තුමා ඇතුළු සියලුම නිලධාරීන් ඒ වාගේම ආණ්ඩුකාරතුමා ඇතුළු නිලධාරීන් පළාත් පාලන කොමසාරිස්තුමා ඒ වගේම අධ්‍යාපන ලේකම්තුමා ඇතුළු මේ සියලු කණ්ඩායමත් අපිට විශාල ශක්තියක් වුණා. ඒ වගේම අපිට මීගහකිවුල ප්‍රදේශයේ යම් යම් ආයතන අපේ කකුලෙන් ඇද්දා විශාල වශයෙන් රාජ්‍ය ආයතන අපිට සහයෝගය ශක්තිය ලබලා දුන්නා රෝහල ඒ වගේම අධ්‍යාපන ආයතනය වගේ ටික දේවල් විශේෂයෙන්ම පොලිස් දෙපාර්තමේන්තුව කන්දකැටිය අපේ හැම කටයුත්තකදීම හිතන්නේ මගේ මන්ත්‍රීවරුන්ගේ ඕනම ප්‍රශ්නයකදී මං කෝල් එකක් දීලා කතා කරත් බොහොම සුහදශීලීව බොහොම නීතිමය වශයෙන් අපිට විසඳලා දෙන්න එතුමා අපිට උදවු කරල තියනවා හිටපු සියලුම නිලධාරීන් එතුමන්ලා මම මේ අවස්ථාවේදී ස්තුති කරනවා. ඒ වගේම මගේ පරිපාලන නිලධාරීතුමිය ඇතුළු සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ට විශේෂයෙන්ම දැනට සිටින කාංචනා ඇතුළු පරණ අයත් නිල්මිණී වගේ අලුත් අයත් සියලු කණ්ඩායමත් ඒ වගේම ගාමිණී ජාතක ඒ වගේම රියදුරු වන විජිත පුතා ඇතුළු ඒ සියලු කණ්ඩායම් අපිට විශාල ශක්තියක් වුණු නිසා තමයි මේ ගමන ගියේ. අපිට වතුර එක දුන්නා අය පාවා අපේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේ දී පුද කරනවා. මං හිතන්නේ අපි සියලු

දෙනාටම හොඳ ගමනක් යන්න වාසනාව ශක්තිය ධෛර්යය ලැබේවි. අපි කවුරුන් ආවත් අපේ එක්කෙනෙක් දෙන්නෙක් හරි මේ ස්ථානයේ නියෝජනය කරාවී එතකොට මේ අපි අරන් ගියා ප්‍රතිපත්තිය ජනතාව අතරට ගියොත් මං හිතන්නේ ඉස්සරහට අපි කරපු වැඩ වල මේ ප්‍රයෝජනය කාට හරි ගන්න පුළුවන් වේවි කියන ගෞරවනීය මතක් කිරීම කරනවා. ඒ නිසා අපි කරපු දේවල් ටික අපි කරා කියන එක ජනතාව අතරට නොගියත් දැන් නම් ටික ටික ගිහිල්ලා වගේ පේනවා. ගමට යනකොට අපි නොගියාට දැන් අපි ඒත් ගමට යනකොට අපිට දැනෙනවා දැන් අපි වැඩ කරා කියලා ජනතාව යම් යම් තැන් වල යනවා. මල ගෙදර, පොලිසියට හරි කතා කරා යම් උදව්වක් කර තිබෙ නම් ඒ උදව්ව යම් ස්ථානයකදී යම් තැනක දි මතක් වෙයි. ඔය හදිසියේ කැගහගෙන මල්ලි කැගහගෙන ගියාට ඒ දේවල් වෙනස් වෙයි මම යනකොට මම දේශපාලනය වශයෙන් පහුගිය දවස් වල මගේ කොට්ඨාසයට ගිය නෑ මාස හයක් විතර මගේ ප්‍රශ්නෙට. නමුත් මගේ කොට්ඨාසයේ පහුගිය දවස් වල ජනතා විමුක්ති පෙරමුණ මාගේ කණ්ඩායම් විශාල රැස්වීම් පැවැත්වූවා. නමුත් අද ඒ වෙනකොට ඒ ගෙවල්වල මම රැස්වීම් පවත්වන්න පුළුවන් තත්ත්වයට ඒ මිනිස්සුත් එක්ක ගිහිල්ලා සාකච්ඡා කරලා අපිට වැරදුනේ මෙතැනයි මාමා අපිට රස්සාවක් දෙන්න් බැරි උනේ මෙන්න මේ හේතුව මත අපිට මේ කරදර අපිට ඇති වුණා. මාමා රටේ මෙන්න මේ ප්‍රශ්න ඇති වුණා කියන ඒක පැහැදිලි කරලා දුන්නොත් මං හිතන්නේ අපි වැඩකරාට වැඩිය ඡන්ද ටිකක් අපිට ගන්න පුළුවන් වේවි. ඉතින් ඒ හින්දා මම දැක්ක කරුණු අනුව අපිට සාකච්ඡා කරලා අපිට ජයග්‍රහණය ගන්න පුළුවන් කණ්ඩායමක් තමයි මෙතන ඉන්නේ. ඒ නිසා අපිට ජයග්‍රහණය කිරීමේ හැකියාව තියෙනවා. කොහොමහරි ප්‍රාදේශීය සභාවට එන්න හැකියාවක් වැඩි කොටසකට තියෙනවා. ඡන්දේ කියන්නේ අමුතු දෙයක්. මොනවා වෙයිද කියලා කියන්න බැහැ. ඡන්දය ඔය කොච්චර කිව්වත් තියයි ද නැද්ද කියලා අපිට කියන්න බැහැ. ඒ නිසා ඔබ සියලු දෙනාටම මං හිතන්නේ හොඳ ගමනක් යන්න තිස් තුන් කෝටියක් දෙවි දේවතාවහන්සේලාගේ ආනුභාවයෙන් වාසනාව ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා.

ඔබ සියලු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තූතියි. මීලඟ සභා වාරය 2023.03.03 දින පැවැත්වීමට නියමිත බවද දැනුවත් කරන ලදි.

සභාපති
ප්‍රාදේශීය සභාව,මීගහකිවුල

සභාපති
එස්.එම්.එල්.එච්.ජයවර්ධන
ප්‍රාදේශීය සභාව. මීගහකිවුල

2023 /03/03.............................................. වන දින මීගහකිවුල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදි පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේදි ගරු ප්‍රාදේශීය සභා ~~උප සභාපති~~/ගරු මන්ත්‍රී R.P. කපිල ආනන්ද රත්නායක මැතිතුමා විසින් යෝජනා කිරිමෙන් හා ගරු ප්‍රාදේශීය සභා ~~උප සභාපති~~/ගරු මන්ත්‍රී D.R. චන්ද්‍රසිරි දිසානායක............මැතිතුමා විසින් ස්ථිර කිරිමෙන් 2023 /02/01.............................................. දින පැවැත්වූ මාසික මහ සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව ඒකමතිකව පිළිගන්නා ලදි.

එස්.එම්.එල්.එච්.ජයවර්ධන,
සභාපති,
ප්‍රාදේශීය සභාව, මීගහකිවුල.

සභාපති
එස්.එම්.එල්.එච්.ජයවර්ධන
ප්‍රාදේශීය සභාව. මීගහකිවුල